වාර්ෂික වාර්තාව සහ ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்கு அறிக்கையும்

ANNUAL REPORT AND ACCOUNTING

2020

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

இலங்கை சமூகப் பாதுகாப்புச் சபை

SRI LANKA SOCIAL SECURITY BOARD

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා
හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில்
மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு

Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance,
Self Employment and Business Development

පූර්විකාව

I.	දැක්ම හා මෙහෙවර	3
II.	සභාපතිතුමාගේ පණිවුඩය	4
III.	සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය	5
IV.	හිටපු සභාපතිවරු, සාමාන්‍යාධිකාරිවරු හා 2020 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩලය	6
V.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය	7
VI.	ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය	8

1. පාලන අංශය 9

1.1	ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම	9
1.2	අනුමත කාර්යය මණ්ඩල හා පුරප්පාඩු	9
1.3	අනුමත කාර්යය මණ්ඩල වැඩිකිරීම හා පුරප්පාඩු පිරවීම	11
1.4	2020 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්	11
1.5	පාලන අංශයේ වර්තමාන කාර්යය මණ්ඩලය	12
1.6	පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්	12
1.7	භෞතික සම්පත්	13
1.8	සන්නිවේදන පහසුකම්	13
1.9	ප්‍රවාහන පහසුකම්	13
1.10	දැනට තිබෙන වාහනවල විස්තර	14
1.11	විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු	15
1.12	තොරතුරු තාක්ෂණ ඒකකය	16
1.13	2020 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදුකළ කාර්යයන්	16
1.14	තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යය මණ්ඩලය	16

2. සමාජ ආරක්ෂණ අංශය 17

2.1	ප්‍රධාන කාර්යයන්	17
2.2	ප්‍රතිලාභ ගෙවීම	17
2.3	සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල	17
2.4	යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ වන නිලධාරීන්	17
2.5	සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය	18
2.6	2020 වර්ෂයේ සාමාජිකයින් බඳවාගැනීමේ ප්‍රගතිය	19
2.7	2020 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම්	27
2.8	2020 වර්ෂයේ දායකයින්ගෙන් අය කළ මුදල්	27
2.9	2020 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම වැඩසටහන්	27
2.10	සමාජ ආරක්ෂණ අංශයේ ගැටලු	28

3. මුදල් අංශය 29

3.1 පොදු කරුණු 29
3.2 ආයතනය සතු වත්කම් 30
3.3 2020 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන 30
3.4 මුදල් අංශයේ කාර්යය මණ්ඩලය 30

4. අභ්‍යන්තර විගණන අංශය 31

4.1 විෂය පථය 31
4.2 කාර්යය භාරය 31
4.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 32
4.4 2020 වර්ෂයේ ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා 32
4.5 අභ්‍යන්තර විගණන අංශයේ කාර්යය මණ්ඩලය 32

5. ස්තූතිය 33

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

දැක්ම

"සමාජ ආරක්ෂණයෙන් සුරක්ෂිත වූ අභිමානවත් ජාතියක්"

මෙහෙවර

"අභිමානවත් ජාතියක් ගොඩනැගීම උදෙසා සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා නියාමනය මඟින් යහපාලන ප්‍රතිපත්තිවලට අනුගත වෙමින් ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, සුරක්ෂිතබව වෙනුවෙන් රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ උපාය මාර්ගික සම්බන්ධතා ගොඩ නගමින් තිරසාර සංවර්ධනයක් කරා....."

සභාපතිතුමාගේ පණිවුඩය

ජාත්‍යන්තර කම්කරු සංවිධානයට අනුව ව්‍යාධිය, මාතෘත්වය, සේවස්ථ තුවාලවීම, විරැකියාව, ශරීර ශක්තිය හීනවීම, වෘද්ධභාවය හා මරණය හේතුකොටගෙන ඉපයීම නොමැති වීමෙන් හෝ සැලකිය යුතු ප්‍රමාණයකින් අඩුවීමක් සිදුවිය හැකි ආර්ථික හා සමාජීය ආපදා පිටුදැකීම අරඹයා පොදු සහන ක්‍රියාවලියක් මඟින් සමාජය විසින් තම සාමාජිකයන්ට සපයනු ලබන ආරක්ෂණය හා දරුවන් සහිත පවුල්වලට සපයනු ලබන සහනාධාර සමාජ ආරක්ෂණය වේ. ශ්‍රී ලංකාවේ සීඝ්‍රයෙන් ඉහළයන වැඩිහිටි ජනගහනය පිළිබඳව අවධානය යොමුකරන විට ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සුරක්ෂිත කිරීම සඳහා යම් සමාජ ආරක්ෂණ ක්‍රමයක දැඩි අවශ්‍යතාව ඉස්මතු වී ඇත. එම පසුබිම තුළ ජාතික ආර්ථිකය නගා සිටුවීමට විශාල මෙහෙයක් ඉටුකරන විශ්‍රාම වැටුපක හිමිකම නොමැති සේවා නියුක්තිකයන්ට ද වෘත්තීය සුරක්ෂිතතාව තහවුරු කිරීම, අර්ථවත් විශ්‍රාම දිවියකට ඉඩප්‍රස්ථාව සැලසීම, වියපත් ජනගහනය ඉහළයාම මඟින් සමාජයට හා රජයට ලැබෙන අභියෝගයන්ට සාර්ථක ව මුහුණ දීමට **විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට** හැකියාව ඇත.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩල පනතින් හා 1999 අංක 33 දරණ සංශෝධිත පනතින් පිහිටුවා මුදල් අමාත්‍යාංශය යටතේ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. වර්තමාන රජයේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ප්‍රයෝගිකව ක්‍රියාවට නංවමින් රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම මෙම මණ්ඩලයේ කාර්ය භාරය වන අතර එමඟින් විශ්‍රාම වැටුප් ලබා දීම, හදිසි අකර්මන්‍යතවයක දී හා මරණයක දී මූල්‍ය සහන ලබා දීම ආවරණය වේ.

රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම නොමැති සෑම ශ්‍රී ලාංකික පුරවැසියෙකු සඳහාම රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම ලබා දීම සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරයි. මෙම යෝජනා ක්‍රම යටතේ මේ වන විට රාජ්‍ය ව්‍යවස්ථාපිත මණ්ඩල සේවකයින්, වෘත්තිකයන්, පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්, විදේශ රැකියා නියුක්තිකයින්, ස්වයං රැකියාලාභීන්, කලාකරුවන් ආදී විවිධ වූ ක්ෂේත්‍රයන්හී නියලෙන 776,993 ක් විශ්‍රාම වැටුප් සාමාජිකත්වය ලබාගෙන ඇත. මෙයින් 31,769 ක ප්‍රමාණයක් මේ වන විටත් විශ්‍රාම වැටුප් ලබා ගන්නා අතර 2,402 ඉක්ම වූ සාමාජික සංඛ්‍යාවක් අර්ධ අබලතා, පූර්ණ අබලතා හා මරණ පාරිතෝෂික හිමිකම් ලබාගෙන ඇත.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ අභිවෘද්ධිය තහවුරු කිරීම මූලික කරගනිමින් හා ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම මූලික කරගනිමින් කාලෝචිත ලෙස සකසන ලද සෞභාග්‍ය නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වා දීම, මුහුණු පොත (Facebook) මඟින් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය කිරීම, කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීම, දීප ව්‍යාප්ත ස්වාධීන අලෙවි ජාලය ශක්තිමත් කිරීම මෙන්ම නව සංවර්ධන ව්‍යාපෘති 25 ක් ඵලදායීව ක්‍රියාත්මක කිරීම මඟින් ආයතනයේ සුභසිද්ධිය තහවුරු කිරීම මගේ අපේක්ෂාවයි. ඒ යටතේ විවිධ ආයතන, විවිධ වෘත්තීය කණ්ඩායම් ඇතුළු විශ්‍රාම වැටුප් නොලබන විවිධ පුරවැසියන් මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කර ගැනීම මඟින් අරමුදල ශක්තිමත් කිරීම මෙන්ම විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සමාජගත කිරීම මගේ අභිප්‍රායයි.

වසර 25 ක කාලයක් පුරා ක්‍රියාත්මකව පවතින ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය සියලුම නිලධාරීන්ගේ සහයෝගය සහ උසස් කැපවීම හේතුවෙන් මෙපමණ කාලයක් අඛණ්ඩව ජනතාවට සේවයකරන, මෙකී ජයග්‍රහණයන් ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් සහයෝගය ලබා දුන් සියලුම නිලධාරීන් වෙත කෘතඥතාවය පිරිනැමීමට ද මෙය අවස්ථාවක් කර ගනිමි.

සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය



සමන් හඳරාගම
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - සමාජ විද්‍යාව
අධ්‍යයනාංශ ප්‍රධාන, සමාජීය විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.
2021.01.31

සාමාන්‍යාධිකාරීතුමාගේ පණිවුඩය

2020 වර්ෂය ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට අභියෝගාත්මක වසරක් විය.2020 වසරේ පෙබරවාරි මාසයේ දී ජේෂ්ඨ කථිකාචාර්ය සමන් හඳුරාගම මහතාගේ සභාපතිත්වයෙන් යුත් නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්විය.2020 මාර්තු මාසයේ පටන් ශ්‍රී ලංකාවේ පැතිරයාමට පටන්ගත් කොවිඩ් 19 වසංගත තත්වය තුල මණ්ඩලයේ සේවාවන් අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා නව උපක්‍රම ක්‍රියාවට නංවන ලදී. ඒ මඟින් ඉදිරි වර්ෂවල මණ්ඩලයේ සේවාවන් වල වර්ධනය සඳහා අවශ්‍ය අඩිතාලම තව දුරටත් ශක්තිමත් කරන ලදි.

2020 වසරේ 776,993 ක් පමණ වූ අප මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සාමාජිකත්වය සඳහා තවත් පුරවැසියන් 25 678 ක් පමණ බඳවා ගැනීමට හැකි විය. විශ්‍රාම වැටුප් ක්‍රමවල සාමාජිකයින් සඳහා විශ්‍රාම වැටුප් සහ අනිකුත් ප්‍රතිලාභ ලෙස 2020 වසරේ රු. 337,207,502.00 ක් ලබා දීමට ද හැකි විය.

විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවල සාමාජිකයින්ට තම ගිණුම් ශේෂයන්වල තොරතුරු වඩාත් පහසුවෙන් ලබාගත හැකි පරිදි සේවා කටයුතු වඩාත් කාර්යක්ෂමව කිරීම සඳහා නව පරිගණක පද්ධතියක් ස්ථාපිත කිරීමේ වැඩ කටයුතු 2020 වසරේ දී ආරම්භ කරන ලදි. කාර්යය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් 20% ක් පමණ වූ පුරප්පාඩු පිරවීමේ කටයුතු ආරම්භ කරමින් නව බඳවා ගැනීමේ කටයුතු සිදු ආරම්භ කිරීමට හැකි විය.

මණ්ඩලයේ ස්ථිර කාර්යය මණ්ඩලයට අමතරව පුද්ගලික අංශයෙන් නියෝජිතයන් අලෙවිකරණ කටයුතු සඳහා සම්බන්ධකර ගනිමින් ස්වාධීන අලෙවි ජාලයේ කටයුතු දීප ව්‍යාප්ත මට්ටමින් ව්‍යාප්ත කිරීම ආරම්භ කරන ලදි.

මණ්ඩලයේ අලෙවිකරණ ජාලය සඳහා සම්බන්ධ වී සිටින රාජ්‍ය නිලධාරී තන්ත්‍රය තව තවත් පුළුල් කිරීමේ කටයුතු ආරම්භ කරමින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් සේවය ලබා ගැනීමේ කටයුතු ආරම්භ කරන ලදි.

සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයන් වඩාත් ජනතාවට සමීප කිරීම සඳහා අවශ්‍ය නෛතික පදනම වඩාත් පුළුල් කිරීම සඳහා සමාජ ආරක්ෂණ මණ්ඩල පනතට අවශ්‍ය නව සංශෝධන හඳුන්වා දීමේ කටයුතු ආරම්භ කිරීමටත් , නව යෝජනා ක්‍රම සහිත ගැසට් පත්‍රයන් හඳුන්වා දීමේ කටයුතු ආරම්භ ආරම්භ කිරීමටත් 2020 වසරේ හැකි විය.

මණ්ඩලයේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා තනි තනි පුද්ගලයන් ආරක්ෂණය කරගැනීමේ ක්‍රමවේදයට අමතරව ආයතන , සමිති , සංගම් , සංවිධාන සමඟ සම්බන්ධ වී එහි සාමාජිකයින් යෝජනා ක්‍රම වලට ඇතුළත් කර ගැනීමේ ක්‍රමවේදය ක්‍රියාවට නංවන ලදි. ඒ අනුව පතල් ක්ෂේත්‍රය , පෞද්ගලික බස් රථ කාර්යය මණ්ඩලය , නාවික කාර්යය මණ්ඩල , නීතිඥ සංගමය ආදී ක්ෂේත්‍ර 20 පමණ සඳහා ව්‍යාප්ත යෝජනා ඉදිරිපත් කිරීමට හැකි විය.

1947 සමාජ ආරක්ෂණ කොමිෂන් සභා වාර්තාවන් සමඟ ඇරඹුණු සමාජ ආර්ථික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමවේදය 1996 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩල පනත මඟින් වඩාත් අර්ථ ගැනීමේ කාර්යයභාර්ය 2020 වසරේ දැමූ පදනම සමඟින් 2021 වසරේ වඩාත් පුළුල් කාර්යයභාරයන් සිදු කිරීමට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට හැකිවනු නොවනුමානය.

මේ සඳහා සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ශෙහාන් සේමසිංහ මැතිතුමන් ,රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් නීල් හපුහින්න මැතිතුමා ප්‍රමුඛ නිලධාරීන් හා අප මණ්ඩලයේ සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලත් , තාක්ෂණ කමිටුවත් , විගණන කමිටුවත් , සියලු කාර්ය මණ්ඩලයත් සහ අප මණ්ඩලයේ අනෙකුත් සියළුම කොටස්කරුවන් (Stakeholders) සඳහා ප්‍රණාමය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.



කේ.ඒ.එස්.පී කළුආරච්චි
සාමාන්‍යාධිකාරී

හිටපු සභාපතිවරු

නම	කාල සීමාව		
වී. ජෙගරාසසිංගම් මහත්මිය	1997.01.01	-	1999.11.01
එස්. කාරියවසම් මහතා	1999.11.08	-	2000.11.01
කේ. ජයලත් මහතා	2000.11.24	-	2002.02.06
ආර්.එම්.ඩි.බී. බෝගහකුඹුර මහතා	2002.02.07	-	2004.01.25
ආනන්ද ගාල්ලෙආරච්චි මහතා	2004.02.03	-	2004.06.01
ඩී.කේ.ආර්.වීරසේකර මහතා	2004.06.15	-	2005.12.15
ලක්ෂ්මන් හිරිමුතුගොඩ මහතා	2005.12.27	-	2006.09.18
සුනිල් සමරවීර මහතා (වැ.බ.)	2006.09.19	-	2006.10.11
සරත් කීර්තිරත්න මහතා	2006.10.12	-	2010.05.05
නිමල් චන්ද්‍ර අමරසිංහ මහතා	2010.05.17	-	2011.12.31
නීතිඥ සුමනා ආරියදාස මහත්මිය	2012.01.03	-	2015.01.21
සුමතිපාල කාරියවසම් මහතා	2015.02.10	-	2015.12.07
කීර්ති සුරංජිත් මාවැල්ලගේ මහතා	2015.12.09	-	2018.05.15
ජේ. ඒ. එස් ජයකොඩි මහතා	2018.05.18	-	2018.10.26
දේවක වීරසිංහ මහතා	2019.02.11	-	2019.12.06


හිටපු සාමාන්‍යාධිකාරිවරු

නම	කාල සීමාව		
රණතුංග හේමචන්ද්‍ර මහතා	1996.09.25	-	1998.08.31
අශෝක පීරිස් මහතා	1998.09.01	-	2000.02.01
බී.ඒ.සෝමපාල මහතා	2000.02.02	-	2002.08.16
කේ.ජී.ජී. විජේවර්ධන මහතා	2002.09.16	-	2003.12.31
පී.ඊ.සි. නේසයියා මහතා	2004.01.01	-	2007.10.12
ජේ.එම්. විජයරත්න මහතා	2008.01.01	-	2009.07.23
එන්.ජේ. පතිරණ මිය	2009.07.24	-	2010.07.23
කේ.එන්.ජේ. කුරේ මහතා	2010.07.27	-	2012.01.26
ධම්මික පාදුක්ක මහතා	2014.03.17	-	2017.11.09
කේ. ඒ. තිලකරත්න මහතා	2018.01.16	-	2018.07.15
බී.ටී.කේ.නිශංක මහතා	2019.12.02	-	2020.06.20
නිමල් කොටවලගෙදර මහතා	2020.06.22	-	2020.12.22

අධ්‍යක්ෂ මණ්ඩලය - 2020 වර්ෂය

නම		තනතුර
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සමන් හඳුරාගම මහතා	-	සභාපති
ඩඩ්.එම්.සුනිල් ශාන්ත වීරසේකර මහතා	-	ක්‍රියාකාරී අධ්‍යක්ෂ
නීතිඥ එච්.ආර්.පරශක්ති සේනානායක මහතා	-	අධ්‍යක්ෂ
ආචාර්යය ධම්මික දිසානායක මහතා	-	අධ්‍යක්ෂ
නීතිඥ ජානක රත්නායක මහතා	-	අධ්‍යක්ෂ
අරුණ කුමාරවඩු මහතා	-	අධ්‍යක්ෂ
කේ.එම්.කුමාරසිරි මහතා	-	අධ්‍යක්ෂ

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ සංවිධාන ව්‍යුහය



ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යයභාරය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන් වෙත විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ලබාදීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යභාරය වේ.

1996 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පනතේ ප්‍රකාරව 2006 සැප්තැම්බර් 25 දිනැති අංක 1464/5 දරණ අතිවිශේෂ ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත්කරන ලද යෝජනාක්‍රම 06 ක් ක්‍රියාත්මක කරන ලදී.

ආර්ථික වශයෙන් ඵලදායී යෝජනාක්‍රම ක්‍රියාත්මක කිරීම හා සාමාජිකයින් වෙත ඉහළ හා සුරක්ෂිත විශ්‍රාම වැටුපක රැකවරණය සැලසීම පෙරදැරිව වර්තමානය වන විට “සුරැකුම” යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත.

සුරැකුම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18 සිට 59 දක්වා රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති තැනැත්තන්ට දායකවිය හැකි අතර, වාරික ගෙවීමේ හැකියාව මත සාමාජිකයාට අවශ්‍ය ප්‍රමාණයක විශ්‍රාම වැටුප් ලබාගත හැකිය.

2012 ඔක්තෝම්බර් 11 දිනට යෙදී තිබුණ "ගැහැණු දරුවාගේ ජාත්‍යන්තර දිනය" ට සමගාමීව "ආරම්භය" පුර්ව සැලසුම් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හඳුන්වා දෙන ලදී. එම යෝජනා ක්‍රමය සඳහා වයස අවුරුදු 18ට අඩු දරුවන්, සිය දෙමාපිය/ භාරකරු භාරකත්වය යටතේ සාමාජික කල හැකි අතර, වයස අවුරුදු 18 සම්පූර්ණ වූ පසු ඔවුන් සුරැකුම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට මාරුකර ගිණුමේ පවතින ශේෂය අනුව විශ්‍රාම වැටුප් හිමිකම ලබාදේ.

යෝජනා ක්‍රමයේ ප්‍රතිලාභ

- වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා සාමාජිකයාට මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
- සාමාජිකයා විශ්‍රාමිකයෙකු ලෙස මියගිය විට සමාජිකයාගේ වයස අවුරුදු 80 දක්වා කලත්‍රයාට විශ්‍රාම වැටුප ගෙවීම.
- ස්ථිර අර්ධ අබලතාවක දී වයස අනුව ගැලපූ රු.25,000/- දක්වා පාරිතෝෂික මුදලක් සහ නියමිත වාරික ගෙවීමෙන් පසු වයස අවුරුදු 60 සිට විශ්‍රාම වැටුප
- ස්ථිර පූර්ණ අබලතාවක දී වයස අනුව ගැලපු රු.50,000/- දක්වා පාරිතෝෂිකය සහ ශුද්ධ දායක මුදල හෝ අබලතාවට පත් වූ දිනයේ සිට ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුප
- විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගියහොත් යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදීම.

යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය ලබාගැනීම මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා වෙනත් බලය පවරන ලද නිලධාරීන් මඟින් සිදුකළ හැකිය.

වාරික ගෙවීම ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව, තැපැල් කාර්යාල හා බලය පවරන ලද ග්‍රාම නිලධාරීන් මඟින් හා මෙම මණ්ඩලයේ කාර්යාල මඟින් සිදුකළ හැකිය.

1. පාලන අංශය

1.1. ස්ථාපිත කිරීම, කාර්යාල පිහිටුවීම හා වෙනස්වීම

1996 වර්ෂයේ දී සුවසිරිපායේ පිහිටි සෞඛ්‍ය, මහාමාර්ග හා සමාජ සේවා අමාත්‍යාංශයේ දී 1996 අංක 17 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය පනත යටතේ 1996 ඔක්තෝම්බර් මස 16 වන දින ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කටයුතු ආරම්භ කරන ලදී. ඉන් අනතුරුව බොරැල්ලේ පිහිටි සමාජ සේවා දෙපාර්තමේන්තු කාර්යාල ගොඩනැගිල්ල තුළ සමාජ සේවා අමාත්‍යාංශය යටතේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය පිහිටුවන ලදී.

1997 මාර්තු මාසයේ දී කොළඹ 06, ගාලු පාරේ, අංක 585 දරණ ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමක් මත කුලියට ගෙන මණ්ඩල කාර්යාලය එහි පිහිටුවීම දෙවන අදියර යටතේ සිදුවිය. අනතුරුව 1999 අංක 33 දරණ සමාජ ආරක්ෂණ මණ්ඩලය (සංශෝධන) පනත මඟින් මුල් පනත සංශෝධනය කරන ලදී. අනතුරුව 2003.07.01 දින සිට නුගේගොඩ, නාවල පාරේ, අංක 150 ඒ, දරණ ස්ථානයේ කාර්යාලය ස්ථාපනය කරන ලදී.

2010.04.30 දින සිට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ 2010.12.01 වන දින සිට අංක 125, නාවල පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ස්ථානයේ ප්‍රධාන කාර්යාලය ස්ථාපනය කරන ලදී.

2013.03.06 දින ප්‍රධාන කාර්යාලය අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ලිපිනයේ මණ්ඩලය විසින් මිල දී ගත් ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලද අතර, එය "සමාජ ආරක්ෂණ පියස" ලෙස නම් කෙරින. මෙමඟින් වඩාත් විශ්වාසදායි හා කාර්යක්ෂම සේවාවන් සැපයීමට හැකියාව ලැබී තිබේ. වර්තමානය වන විට සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි සෑම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයකම දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර සේවා කටයුතු වඩාත් පුළුල් කර ඇත.

1.2. අනුමත කාර්යය මණ්ඩලය හා පුරප්පාඩු

අතිගරු ජනාධිපතිතුමියගේ ලේකම් වෙත ආමන්ත්‍රිත, වැටුප් හා සේවක සංඛ්‍යාව කමිටුවේ සභාපතිතුමාගේ අංක එස්.ආර් 35/339 හා 1997 ජූලි 17 දින දරණ ලිපියෙන් ඉල්ලුම්කර තිබූ සේවක මණ්ඩල බඳවාගැනීම අදියර කීපයකට වෙන්කරන ලෙසත්, 1997 වර්ෂය තුළ තනතුරු 56කට පමණක් පත්වීම් කිරීම ප්‍රමාණවත් බවත් නිර්දේශ කර තිබුණි. 1997 සැප්තැම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එකී නිර්දේශය අනුමත කරන ලද අතර, කාර්යය මණ්ඩලය 159ක් දක්වා බඳවා ගැනීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබේ. ඒ අනුව පසුව මහා භාණ්ඩාගාරය විසින් සේවක සංඛ්‍යාව 88ක් දක්වා බඳවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත.

1999 සිට වරින්වර සේවක මාරුවීම්, ඉල්ලා අස්වීම් නිසා පුරප්පාඩු දිගින් දිගටම පැවති අතර, එවකට සේවයේ යෙදී සිටි ස්ථීර කාර්යය මණ්ඩලය 179 දෙනෙකි. තනතුරු අනුව එම සේවක සංඛ්‍යාව බෙදී ඇති අයුරු පහත වගුවේ දැක්වේ. කාර්යය මණ්ඩලයේ ප්‍රමාණවත් නොවීම මත ආයතනයේ ප්‍රගතිය අපේක්ෂිත මට්ටමට ළඟා නොවන බැවින්, කටයුතු වඩාත් පුළුල් කිරීම සඳහා 198 කින් සමන්විත නව කාර්යය මණ්ඩලයක් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර, අදාළ බඳවාගැනීමේ පටිපාටිය සකස් කර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසම වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව 2012.09.14 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සමාජ ආරක්ෂණ මණ්ඩලයේ බඳවාගැනීම් පරිපාටිය අනුමත කරන ලදී. දැනට පවතින පුරප්පාඩු 42ක් පවතින අතර, මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති DMS/ Policy/ Recruitments අංක දරණ චක්‍රලේඛය මඟින් බඳවා ගැනීම් අත්හිටුවා ඇති නමුත්, සේවා අත්‍යවශ්‍යතාවය මත මැතිවරණ කොමිෂන් සභාවේ විශේෂ අනුමැතිය යටතේ නියෝජ්‍ය

සාමාන්‍යාධිකාරී (මුදල්) , සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්) සහ පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග) යන තනතුරු 03 බඳවා ගැනීම් කටයුතු සිදු කරන ලදී. අනිකුත් තනතුරු පුරප්පාඩු සඳහා අදාල චක්‍රලේඛණයයෙහි නැවත බඳවා ගැනීමට දැනුම් දීමෙන් පසු බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

කාර්යය මණ්ඩල විශ්ලේෂණය - 2020 වර්ෂය
(2020.12.31 දිනට)

අනු අංකය	තනතුරු නාමය	අනුමත	දැනට සිටින	පුරප්පාඩු
1	සාමාන්‍යාධිකාරි	1	1	0
2	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය)	1	0	1
3	නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ)	1	1	0
4	සහකාර සාමාන්‍යාධිකාරි (මූල්‍ය)	1	1	0
5	සහකාර සාමාන්‍යාධිකාරි (බඳවා ගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	1	1	0
6	සහකාර සාමාන්‍යාධිකාරි (පාලන)	1	1	0
7	සහකාර සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	1	1	0
8	අභ්‍යන්තර විගණක	1	1	0
9	කළමණාකරු (පාලන)	1	1	0
10	කළමණාකරු (ඔප්පු සේවා)	1	1	0
11	කළමණාකරු (රක්ෂණ)	1	1	0
12	ගිණුම් නිලධාරි (මූල්‍ය)	1	1	0
13	සමාජ ආරක්ෂණ නිලධාරී (ප්‍රවර්ධන)	1	1	0
14	සමාජ ආරක්ෂණ නිලධාරි (විශ්‍රාම වැටුප්)	1	0	1
15	සමාජ ආරක්ෂණ නිලධාරි (තොරතුරු තාක්ෂණ)	1	0	1
16	ගිණුම් නිලධාරි (රැස්කිරීම්)	1	1	0
17	ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරි	6	5	1
18	විගණන නිලධාරින්	2	2	0
19	සම්බන්ධීකරණ නිලධාරින්	49	32	17
20	විමර්ශන නිලධාරීන්	2	1	1
21	දත්ත පරිපාලක	1	1	0
22	පරිගණක ජාල සහකරු	1	0	1
23	සහකාර පරිගණක වැඩසටහන් සහකාර	1	1	0
24	පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	1	1	0
25	පොත් තබන්නා	2	1	1
26	කළමනාකරණ සහකාර	74	63	11
27	රියදුරු	9	8	1
28	කාර්යාල කාර්ය සහායක	34	28	6
එකතුව		**198**	**156**	**42**

1.3. අනුමත කාර්යය මණ්ඩලය වැඩි කිරීම හා පුරප්පාඩු පිරවීම

මණ්ඩලයේ ඉලක්කගත අරමුණු හා පරමාර්ථ ළඟා කරගැනීම සඳහා අවශ්‍ය කාර්යය මණ්ඩලය ස්ථාපිත කිරීමත් පුහුණුව සහ සංවර්ධනය තුළින් ඔවුන්ගේ කාර්යය සාධනය ඉහළ නැංවීමට කටයුතු කිරීම සිදු කරනු ලබන අතර, කාර්ය මණ්ඩල ප්‍රතිව්‍යුහගත කිරීම මඟින් අනුමත කාර්ය මණ්ඩලය වන 198 ප්‍රමාණය 561 දක්වා වැඩි කර ගැනීමට කටයුතු සිදුකරනු ලබයි. එමෙන්ම, පුරප්පාඩුව පවතින තනතුරු සඳහා කඩිනමින් බඳවා ගැනීම් ඉහළ සේවා ඵලදායිතාවක් ළඟා කරගැනීමටත් කටයුතු සිදු කෙරේ.

1.4. 2020 වර්ෂයේ අස්වීම් හා විශ්‍රාම යාම්

මණ්ඩලයේ තනතුරු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන්ගෙන් බොහෝමයක් රජයේ විශ්‍රාම වැටුපක් හිමි උපාධිධාරීපත්වීම් ලැබීම නිසා සේවයට බැඳී ඉතා කෙටිකාලයක් තුළ මණ්ඩලයේ සේවයෙන් ඉල්ලා අස්වන බව පෙනී යන අතර, එම නිලධාරීන් අතරින් සම්බන්ධීකරණ නිලධාරී තනතුර හා කළමනාකරණ සහකාර තනතුර සඳහා බඳවා ගන්නා ලද නිලධාරීන් මෙසේ වැඩි ප්‍රමාණයක් ඉල්ලා අස්වී ඇති බව පහත සඳහන් කර ඇති තොරතුරු මගින් තහවුරු වේ. ඉල්ලා අස්වී ඇති නිලධාරීන් දාහතරදෙනාගෙන් (14) නිලධාරීන් එකලොස්දෙනෙකුම (11) ඉල්ලා අස්වීමට හේතුවී ඇත්තේ රජයේ විශ්‍රාම වැටුපක් හිමි උපාධිධාරීපත්වීම් ලැබීම නිසා බව වැඩිදුරටත් සඳහන් කිරීමට පුළුවන.

	නම		තනතුර		
01.	එච්.එම්.එම්.සචින්තන දොරටියාව මයා	-	සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ)	-	ඉල්ලා අස්වීම
02.	හිරුණි නිරාශා මෙය	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
03.	තරංගා ප්‍රභාෂිණි මිය	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
04.	එච්.එම්.පී.එම්.ජයසේන මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	විශ්‍රාම යාම
05.	ඊ.ඊ.අයි.ටී.ගමගේ මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
06.	ඩි.බී.කේ.සෙනෙවිරත්න මිය	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
07.	එස්.එම්.එම්.එන්.විජේකෝන් මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
08.	කේ.එච්.එස්.කුරුගමගේ මයා	-	සම්බන්ධීකරණ නිලධාරී	-	ඉල්ලා අස්වීම
09.	බී.වී.එන්.යූ.උදයනන්ද මිය	-	පොත් තබන්නා	-	ඉල්ලා අස්වීම
10.	එම්. ජී. සී. නිරෝෂණි මෙය	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
11.	කේ. ඒ. විකසිත මයා	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
12.	ඩබ්.ජී.ජී.එම්.එල්.ගොඩමුන්න මෙය	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
13.	එම්.මයුපාන් මයා	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
14.	පී.කේ.ආර්.එස්.විජේසේකර මයා	-	කළමනාකරණ සහකාර	-	ඉල්ලා අස්වීම
15.	නිමල්සිරි රාජපක්ෂ මයා	-	කාර්යාල කාර්ය සහායක	-	ඉල්ලා අස්වීම

1.5. පාලන අංශයේ වර්තමාන කාර්යය මණ්ඩලය (2020.12.31 දිනට)

තනතුර	නිලධාරි සංඛ්‍යාව
සාමාන්‍යාධිකාරී	1
සහකාර සාමාන්‍යාධිකාරී (පාලන)	1
කළමනාකරු (පාලන)	1
කළමනාකරණ සහකාර	7
සභාපතිතුමාගේ ලේකම් (කළමනාකරණ සහකාර)	1
කාර්යාල කාර්ය සහයක	1
(සභාපතිතුමාට හා ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමාට අනුයුක්ත) කාර්යාල කාර්ය සහයක	1
සාමාන්‍යාධිකාරී (කාර්යාල කාර්ය සහයක)	0
තැපැල් කටයුතු (කාර්යාල කාර්ය සහයක)	1
දුරකථන ක්‍රියාකරු (කාර්යාල කාර්ය සහයක)	1
රියදුරු	8
එකතුව	**23**

1.6. පාලන අංශයේ ප්‍රධාන කාර්යයන්

1. කාර්යය මණ්ඩල බඳවා ගැනීම හා විශ්‍රාම යාම දක්වා වූ විෂය ලිපිගොනු නඩත්තුව.
2. කාර්ය මණ්ඩල විනය කටයුතු සම්බන්ධ විනය පරීක්ෂණ පැවැත්වීම.
3. සේවක කාර්යය ඇගයුම් සඳහා කාර්යක්ෂමතා ඇගයුම් විභාග පැවැත්වීම.
4. කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩමුළු පැවැත්වීම.
5. සමාජ ආරක්ෂණ සම්මාන උළෙල වැනි උත්සව අවස්ථා සංවිධානය කිරීම.
6. වාර්ෂික වාර්තා/ සංයුක්ත සැලැස්ම/ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
7. මාසිකව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු මෙහෙයවීම හා අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සකස් කිරීම.
8. මාසික, කාර්තුමය, වාර්ෂිකව යැවිය යුතු වාර්තා අමාත්‍යාංශය හා අනෙකුත් රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම.
9. ආයතනයේ ගොඩනැගිලි, යන්ත්‍රෝපකරණ හා වාහන නඩත්තු කිරීම හා කල්බදු ක්‍රමය යටතේ වාහන පහසුකම් ලබා ගැනීම.
10. කාර්ය මණ්ඩලයට අවශ්‍ය දසමස් ණය පහසුකම් ලබා දීමට අවශ්‍ය කටයුතු කිරීම.
11. මණ්ඩලයේ ආරක්ෂක සේවා, පිරිසිදු කිරීම් හා වෙනත් ගිවිසුම්ගත සේවා හා යන්ත්‍රෝපකරණ නඩත්තු කිරීමේ වාර්ෂික ගිවිසුම් ඇති කර ගැනීම.
12. මාසිකව විශ්‍රාම වැටුප්ලාභීන්ට නිකුත් කරන චෙක්පත් කඩිනමින් නියමිත දිනට ඔවුන්ට ලබාදීමට අවශ්‍ය කටයුතු කිරීම.
13. තොරතුරු තාක්ෂණ අංශය මඟින් දිස්ත්‍රික් කාර්යාල 25 සහ ප්‍රධාන කාර්යාලය අතර පවතින පරිගණක ජාලය සම්බන්ධ සියලු කටයුතු අධීක්ෂණය කිරීම.

1.7. භෞතික සම්පත්

ප්‍රධාන කාර්යාලය - 2013 මාර්තු මස 06 දින අංක 18, රාජගිරිය පාර, රාජගිරිය පිහිටි මහල් 04කින් යුත් මණ්ඩලයටම අයත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත.

දිස්ත්‍රික් කාර්යාල - දිවයින පුරා සියලු දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සමාජ ආරක්ෂණ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපනය කර ඇත.

1.8. සන්නිවේදන පහසුකම්

ආයතනය සඳහා ලබාගෙන තිබූ දුරකතන පද්ධතිය වැඩි දියුණුකර සෑම අංශයක්ම ආවරණය වන පරිදි නව ගොඩනැගිල්ලේ ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පොදු දුරකථන සම්බන්ධතා 03ක් ෆැක්ස් පහසුකම් ද සමඟ ස්ථාපනය කර ඇත. ඊට අමතරව පහත පරිදි සෘජු දුරකථන සම්බන්ධතා ලබා ගෙන ඇත.

සභාපති	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
ක්‍රියාකාරී අධ්‍යක්ෂ	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
සාමාන්‍යාධිකාරී	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක එකක්
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී 02	-	සෘජු දුරකථන හා ෆැක්ස් අංක දෙකක්
සහකාර සාමාන්‍යාධිකාරී 03	-	දුරකථන තුනක්
අභ්‍යන්තර විගණක	-	දුරකථන එකක්
තැපැල් කටයුතු	-	දුරකථන දෙකක්
ක්ෂණික ඇමතුම්	-	දුරකථන එකක්

ඉහත දුරකථන සම්බන්ධතාවලට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් සඳහා ද දුරකථන පහසුකම් ලබා දී ඇත. ප්‍රධාන කාර්යාලයේ පරිගණක ජාලගත පද්ධතිය ස්ථාපිත කරන ලද අතර, VPN පද්ධතියක් හරහා දිස්ත්‍රික් කාර්යාල වෙත ජාලගත කරමින් සේවා කටයුතු වඩාත් කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇත.

1.9. ප්‍රවාහන පහසුකම්

මණ්ඩලයේ වැඩ කටයුතු ආරම්භ කළ අවස්ථාවේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවෙන් පාවිච්චි කළ වාහන දෙකක් මණ්ඩලයේ කාර්යයන් සඳහා යොදවන ලදි. ඉන්පසුව අතිරේක වාහන දෙකක් ද සමාජ සේවා අමාත්‍යාංශයෙන් ලබාගෙන ඇත. 1997 / 98 වර්ෂ වල දී වාහන 05ක් මිල දී ගෙන ඇත. මෙම වාහන සියල්ල ධාවන තත්ත්වයෙන් පවත්වාගෙන යාම සඳහා අධික අළුත්වැඩියා වියදමක් දැරීමට සිදුවිය. 2006 වර්ෂය අවසානය වන විටත් මණ්ඩලය සතුව පැවතියේ වාහන 07ක් පමණි. ඒවා දැනට ධාවන තත්ත්වයේ පවතී. අවස්ථා ගණනාවකදීම නව වාහන අවශ්‍යතාව පෙන්වා දුන් අතර, 2008 වර්ෂයේ දී මුදල් අමාත්‍යාංශයට වාහනයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් කිරීමෙන් පසු රේගුවෙන් නිදහස් කර ගත් වාහනයක් ලබාගන්නා ලෙස උපදෙස් ලැබුණි. ඒ අනුව මෝටර් රථයක් ලබා ගන්නා ලදී. 2010 වසරේ වාහන 02ක් මිල දී ගැනීමට මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කළ අතර, මුදල් වෙන් කිරීමෙන් පසු මයික්‍රෝ ආයතනයෙන් මයික්‍රෝ රයිනෝ වර්ගයට අයත් වාහන 02ක් මිලදී ගන්නා ලදී.

250 – 6090 කැබ් රථය / 253 – 2818 කැබ් රථය / 32 – 4987 පාත් පයින්ඩර් හා KN – 0006 මයික්‍රෝ රයිනෝ වර්ගයේ ජීප් රථය ඉතා පැරණි තත්ත්වයේ තිබූ අතර, එම වාහන වෙන්දේසි කර විකිණීමට කටයුතු කරන ලදී.

2011 වර්ෂයේ දී යතුරු පැදි 10ක්, 2013 වර්ෂයේ දී නිසාන් ජූක් කාර් රථයක්, බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථයක් සහ 2014 වර්ෂයේ දී ආසන 16ක ටොයොටා හයි - ඒස් වෑන් රථයක්, ස්කූටි වර්ගයේ යතුරු පැදියක් ද මිල දී ගන්නා ලදී.

2017 වර්ෂයේ දී මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ වසර පහක් සඳහා කාර් රථ දෙකක්, ඩබල් කැබ් රථයක් හා ජීප් රථයක් ලබාගෙන ඇති අතර, පිළිවෙලින් 2022.06.30, 2022.11.22 දිනයන්හි අදාළ ගිවිසුම් අවසන් වේ.

1.10. දැනට තිබෙන වාහනවල විස්තර (2020.12.31 දිනට)

වාහන අංකය	වර්ගය	පළමුව ලියාපදිංචි කල දිනය	ඉතා හොඳයි	හොඳයි	අළුත්වැඩියා කර ධාවන තත්ත්වයේ පවතී	අබලන්	ගර්හිත
250 - 6095	ඩබල් කැබ් රථය	1997.10.24			√		
252 - 5463	ඩබල් කැබ් රථය	1998.08.14			√		
KH- 4506	කාර් රථය	2008.09.30		√			
KX- 0914	නිසාන් ජූක් කාර් රථය	2013.10.17		√			
NB - 8428	ටොයොටා හයිඒස් වෑන් රථය	2014.08.18	√				
SP CAU-7691	TOTOTA – AXIO G වර්ගයේ කාර්	2017.06.29	√				
SP CAU-7694	TOTOTA – AXIO	2017.06.29	√				
SP PH-9137	ඩබල් කැබ් රථය FORD RANGER වර්ගයේ	2017.06.29	√				
WP CAH- 4984	ජීප් රථය TOYOTA-FORTUNER වර්ගයේ	2017.11.21	√				
WP AAG -9346	බජාජ් වර්ගයේ ත්‍රී රෝද රථය	2013.04.18		√			
WP WK-3810	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3806	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3789	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3880	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3815	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06				√	
WP WK-3795	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3801	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3882	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WK-3787	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2011.04.06		√			
WP WD-5580	කිනෙටික් වර්ගයේ යතුරු පැදිය	2010.12.31				√	
WP BAR-3240	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3263	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAR-3250	බජාජ් වර්ගයේ යතුරු පැදිය	2014.01.27		√			
WP BAU-0765	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			
WP BAU-0769	ස්කූටි වර්ගයේ යතුරු පැදිය	2014.03.19		√			

1.11. විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු

1. පිරිස්බල තක්සේරුව හා බඳවා ගැනීම් පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලැබීමෙන් පසු පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත.
2. සමාජ ආරක්ෂණය ගම් මට්ටමින් දීප ව්‍යාප්ත කිරීමේ දී, ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවන බව කාර්යය මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය අධ්‍යයනය කිරීම මඟින් තහවුරු කර ගන්නා ලදී. ඒ අනුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත සමාජ ආරක්ෂණ නිලධාරීන් අනුයුක්ත කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වූ බැවින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා නිලධාරීන් 332 බඳවා ගැනීමට අමාත්‍යාංශය වෙත ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා යොමු කර ඇත.

භෞතික සම්පත් ඌණතා

1. පවතින රථවාහන සංචිතය තුළ පැරණි වාහන අධික වීම හේතුවෙන් අළුත්වැඩියා වැය අධික වන නිසා නව වාහන මිල දී ගැනීමට කටයුතු කළ යුතු වේ.
2. දිස්ත්‍රික් කාර්යාල වෙත සේවා කටයුතු විමධ්‍යගත කිරීම සඳහා, භෞතික හා මානව සම්පත් අවශ්‍යතා සපුරාලීම.
3. ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ දැනට කාර්යය මණ්ඩලය සඳහා රැස්වීම් පැවැත්වීමට පහසුකම් නොමැති බැවින් ශ්‍රවණාගාරයක් ඉදිකිරීමට අවශ්‍යව ඇති බැවින්, 2019 වර්ෂයේ ඒ සඳහා සියලු කටයුතු අවසන් කර තිබියදී, මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 5/2019 ප්‍රකාරව ගිවිසුම් අත්සන් කිරීම අත්හිටුවන ලදී. 2020 වර්ෂයේ මූලධන ප්‍රතිපාදන අනුමත නොවූ බැවින් ඉදිකිරීම් කටයුතු සිදුනොකරන ලදී.
4. මෙම මණ්ඩලයේ දිස්ත්‍රික් කාර්යාල ස්ථාපිත කර ඇති අතර, මෙහෙයුම් කටයුතු සිදුකිරීමේ දී නිලධාරින්ගේ ප්‍රවාහන රාජකාරි අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් වාහන නොමැති බැවින් ඒ සඳහා පහසුකම් ඇති කිරීම.

1.12. තොරතුරු තාක්ෂණ ඒකකය

ප්‍රධාන කාර්යයන්

1. නව විශ්‍රාම වැටුප් තොරතුරු කළමනාකරණ මෘදුකාංග පද්ධති ස්ථාපනය කිරීමට අදාල කටයුතු සිදු කිරීම.
2. ආයතනයේ නව වෙනස්කම් සිදුකිරීමේ හා අනෙකුත් කර්තව්‍යයන් සඳහා ඉහල කළමනාකාරිත්වයට අවශ්‍ය වාර්තා ලබා දීම.
3. පරිගණක ජාලය යාවත් කාලීනව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත පරිගණක වැඩසටහන් බිඳ වැටීමකින් තොරව පවත්වාගෙන යාම හා සුරක්ෂිත භාවය තහවුරු කිරීම.
5. පවතින මෘදුකාංග පද්ධතියේ දත්ත සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ ඉදිරි පියවර ගැනීම

1.13. 2020 වර්ෂයේ තොරතුරු තාක්ෂණ ඒකකයෙන් සිදු කළ කාර්යයන්

1. යෝජිත මෘදුකාංග පද්ධතිය සඳහා නව විස්තරාත්මක මෘදුකාංග පිරිවිතර වාර්තාවක් සකස් කිරීම.
2. ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශයේ පරිගණක පද්ධතින් හී දත්ත සමුදාය ප්‍රධාන Server හි ස්ථාපනය කිරීම.
3. දිස්ත්‍රික් කාර්යාල සඳහා වන පරිගණක හා උපාංග ලබා දීම හා අළුත් වැඩියාවන් සිදු කිරීම.
4. Email Server සඳහා ධාරිතාව වැඩි කිරීමට පියවර ගැනීම.
5. යෝජිත මෘදුකාංග පද්ධතිය ලංකා මේඝයේ (Lanka Gouvernement Cloud) හි ස්ථාපනය සඳහා ප්‍රවේශ පහසුකම් එපික් ආයතනය වෙත ලබා දීම.
6. වසංගත තත්ත්වය තුළ නොපමාව විශ්‍රාම වැටුප් ගෙවීම හා දෛනික රාජකාරී කටයුතු සඳහා තාක්ෂණික දායකත්වය ලබා දීම.
7. ප්‍රධාන කාර්යාලයේ සියළු සාමාජිකයන් ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය වෙත ඇතුලත් කිරීමට පියවර ගැනීම.

1.14. තොරතුරු තාක්ෂණ ඒකකයේ කාර්යය මණ්ඩලය

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
සමාජ ආරක්ෂණ නිලධාරී (තොරතුරු තාක්ෂණ)	-	0
දත්ත පරිපාලක	-	1
පරිගණක වැඩසටහන් සහකාර (මෘදුකාංග)	-	1
පරිගණක වැඩසටහන් සහකාර (දෘඩාංග)	-	1
එකතුව	-	**3**

2. සමාජ ආරක්ෂණ අංශය

2.1. ප්‍රධාන කාර්යයන්

1. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය පිළිබඳ ප්‍රචාරණය සහ ප්‍රවර්ධන කටයුතු සැලසුම් කිරීම හා මෙහෙයවීම.
2. සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා එම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබන නිලධාරීන් හා ඉලක්කගත ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම.
3. යෝජනාක්‍රමය පිළිබඳ දැනුවත් කිරීමෙන් පසුව සාමාජිකත්වය ලබාදීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම.
4. පසු වාරික මුදල් ගෙවීම සඳහා අදාළ මහපෙන්වීම සිදුකර ගෙවීම් කිරීමට අවශ්‍ය වන පාස්පොත්, බැංකු බැරපත් ලබාදීම.
5. සාමාජික ගැටලු නිරාකරණය, අක්‍රීය තත්ත්වයකට පත්වන සමාජිකයන් සක්‍රීය කිරීමට අවශ්‍ය විධිවිධාන සැලැස්වීම.
6. ප්‍රධාන කාර්යාලයේ සමාජ ආරක්ෂණ අංශය හා දිස්ත්‍රික් කාර්යාල 25ක් පරිපාලනය කරමින් සේවා කටයුතු කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
7. ආයතන, නිලධාරීන් හා පොදුජන සංවිධාන සම්බන්ධීකරණය කරමින් විශ්‍රාම වැටුප් යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරිම.

2.2. ප්‍රතිලාභ ගෙවීම

1. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දින සිට ජීවිතාන්තය දක්වා අඛණ්ඩව මාසිකව විශ්‍රාම වැටුප ලබාදීම.
2. සාමාජිකයාගේ වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට පෙර සිදුවන සාමාජිකයාගේ මරණය වෙනුවෙන් යැපෙන්නන් සඳහා ප්‍රතිලාභ ගෙවීම , අර්ධ අබලතා, පූර්ණ අබලතා ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කිරීම.
3. “ආරස්සාව” පූර්ව සැලසුම් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ අතිරේක ප්‍රතිලාභ ගෙවීම.

2.3. සේවා ඒකකයන් හා දිස්ත්‍රික් කාර්යාල

ඔප්පු සේවා, විශ්‍රාම වැටුප්, රක්ෂණ හා ප්‍රවර්ධන වශයෙන් ප්‍රධාන කාර්යාලයේ සේවා ඒකක 04ක් සහ සියළුම දිස්ත්‍රික්ක වල පිහිටුවා ඇති කාර්යාල 25 මඟින් සේවා කටයුතු ඉටුකරනු ලැබේ.

2.4. යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධ වන නිලධාරීන්

දිස්ත්‍රික් කාර්යාල සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්, සහයක කාර්ය මණ්ඩලය පත්කර ඇති අතර, ඔවුන් දිස්ත්‍රික් කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය හා සෘජු බදවාගැනීම් කටයුතු සිදුකරනු ලැබේ.

විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන සමඟ ඒකාබද්ධව යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී එම නිලධාරීන්ගේ මැදිහත්වීම ලබා ගැනීමට කටයුතු කර ඇත.

2.5. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යය මණ්ඩලය

ප්‍රධාන කාර්යාලයේ කාර්යය මණ්ඩලය

තනතුර		**තනතුරු සංඛ්‍යාව**
නි.සාමාන්‍යාධිකාරි (සමාජ ආරක්ෂණ)	-	01
ස.සාමාන්‍යාධිකාරි (බදවාගැනීම් හා දිස්ත්‍රික් පරිපාලන)	-	01
ස.සාමාන්‍යාධිකාරි (විශ්‍රාම වැටුප්/රක්ෂණ)	-	01
කළමනාකරුවන් / සම්බන්ධීකරණ නිලධාරීන්		
කළමනාකරු (ඔප්පු සේවා)	-	01
කළමනාකරු (රක්ෂණ)	-	01
කළමනාකරු (විශ්‍රාම වැටුප්)	-	පුරප්පාඩු 01
කළමනාකරු (ප්‍රවර්ධන)	-	01
සම්බන්ධීකරණ නිලධාරීන්	-	01
කළමනාකරණ සහකාර	-	17
කාර්යාල කාර්ය සහයක	-	03
එකතුව		**27**


දිස්ත්‍රික් කාර්යාලයන්හි කාර්යය මණ්ඩලය

තනතුර		**තනතුරු සංඛ්‍යාව**
ජ්‍යෙෂ්ඨ සම්බන්ධීකරණ නිලධාරී	-	05
දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරි	-	27
කළමනාකරණ සහකාර	-	24
කාර්යාල කාර්යය සහයක	-	18
එකතුව		**74**

2.6. 2020 වර්ෂයේ සාමාජිකයින් බඳවාගැනීමේ ප්‍රගතිය


2020 වර්ෂයේ දී සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දිස්ත්‍රික් මට්ටමින් බඳවාගත් නව සාමාජිකයන් පිළිබඳ ප්‍රගතිය

අනු අංකය	දිස්ත්‍රික්කය	**2020** වර්ෂයේ බඳවා ගැනීම් (සාමාජිකයින්)
01	යාපනය	7894
02	මඩකලපුව	3457
03	කුරුණෑගල	4058
04	වව්නියාව	1402
05	මොනරාගල	638
06	මහනුවර	950
07	මුලතිව්	3178
08	අනුරාධපුරය	271
09	ත්‍රිකුණාමලය	355
10	බදුල්ල	56
11	කෑගල්ල	285
12	මන්නාරම	764
13	අම්පාර	1338
14	නුවරඑළිය	72
15	කළුතර	351
16	මාතර	192
17	මාතලේ	60
18	ගම්පහ	60
19	හම්බන්තොට	86
20	කිලිනොච්චිය	138
21	ගාල්ල	26
22	පුත්තලම	66
23	සෘජු	45
24	රත්නපුරය	18
25	පොළොන්නරුව	10
26	කොළඹ	8
	එකතුව	**25778**


2020 වර්ෂයේ බදවාගැනීම් (සාමාජිකයින්)
9000
8000
7000
6000
5000
4000
3000
2000
1000
0
7894
4058
3457
3178
1402
1338
950
764
638
355
351
285
271
192
138
86
72
66
60
60
56
45
26
18
10
8
යාපනය
කුරුණෑගල
මඩකලපුව
මුලතිව්
වවුනියාව
අම්පාර
මහනුවර
මන්නාරම
මොණරාගල
ත්‍රිකුණාමලය
කළුතර
කෑගල්ල
අනුරාධපුරය
මාතර
කිලිනොච්චිය
හම්බන්තොට
චුන්නාකම
පුත්තලම
මාතලේ
ගම්පහ
බදුල්ල
සෘජු බඳවාගැනීම්
ගාල්ල
රත්නපුරය
පොළොන්නරුව
කොළඹ

නව සාමාජිකයින් බඳවාගැනීමේ වාර්ෂික ප්‍රගතිය

අනු අංකය	වර්ෂය	නව බඳවාගැනීම් සංඛ්‍යාව	පළමු වාරික මුදල (රු.)	වාර්ෂික වාරික රැස්කිරීම් (රු.)
01	2012	9184	6,346,406.00	186,449,481.42
02	2013	8769	7,241,924.00	150,372,576.64
03	2014	15995	7,659,336.00	148,994,244.54
04	2015	21599	13,785,940.00	146,383,038.09
05	2016	72351	40,810,755.00	148,869,233.52
06	2017	63141	36,836,723.00	170,959,008.83
07	2018	83362	52,184,761.00	190,456,670.73
08	2019	38543	37,259,390.00	198,042,947.06
09	2020	25778	45,069,707.00	180,257,958.78



2.6.1 2020 වර්ෂයේ පවත්වනු ලැබූ වැඩසටහන් කිහිපයක සුවිශේෂී අවස්ථා

01. පොදු ජන සරණී ජංගම සේවා වැඩසටහන - මොනරාගල (2020.02.25)

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය මඟින් මොනරාගල දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ලැබූ "පොදු ජන සරණී" ජංගම සේවා වැඩසටහන මඟින් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම ප්‍රචලිත කිරීම.





02. "පොදු ජන සරණී" ජංගම සේවා වැඩසටහන - රත්නපුර (2020.02.29)

"පොදු ජන සරණී" ජංගම සේවා වැඩසටහන් මාලාව යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ බටුගෙදර මහා විද්‍යාලයේ පවත්වනු ලැබූ වැඩසටහන.





03. සබරගමු පළාත් රාජ්‍ය නිළධාරීන් සමඟ පැවති සාකච්ඡාව (2020.03.04)

සබරගමුව පළාත් ආණ්ඩුකාරතුමාගේ ප්‍රධානත්වයෙන් සහ සබරගමු පළාත් රාජ්‍ය නිළධාරීන් සහභාගීත්වයෙන් පවත්වනු ලැබූ විශේෂ සාකච්ඡාව සහ දැනුවත් කිරීමේ වැඩසටහන.







04. විදේශගත ශ්‍රී ලංකික ශ්‍රමිකයින් වෙනුවෙන් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හඳුන්වාදීම සඳහා පවත්වනු ලැබූ මූලික සාකච්ඡාව **(2020.05.19)**




05. නැවියන් සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ සහ සාකච්ඡාමය වැඩසටහන **(2020.07.10).**




06. උක් වගාකරුවන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හඳුන්වාදීම සඳහා වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශ ශ්‍රවණාගාරයෙදී පවත්වනු ලැබූ වැඩසටහන **(2020.07.15)**.





07. උක් වගාකරුවන් වෙනුවෙන් සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හඳුන්වාදීම සඳහා ලංකා සීනි පුද්ගලික සමාගම (පැල්වත්ත) පරිශ්‍රයේදී සීනි සමාගම් නිලධාරීන් සහ අප මණ්ඩලයේ නිලධාරීන් අතර පැවති සාකච්ඡාව **(2020.07.28).**





08. යාපනය සහ මඩකලපුව දිස්ත්‍රික් සමාජ ආරක්ෂණ දිස්ත්‍රික් කාර්යාලයේ මූලිකත්වයෙන් "ආරස්සාව " විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට සාමාජික වී සිටින දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රතිලාභ ලබදීම වෙනුවෙන් පවත්වනු ලැබූ උත්සවය **(2020.08.19).**





09. ස්වයං රැකියාලාභීන් සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ හඳුන්වාදීම වෙනුවෙන් පවත්වනු ලැබූ විශේෂ සාකච්ඡාව **(2020.08.19).**





10. අප මණ්ඩලයේ කේෂ්ත්‍ර චාරිකාවකට සහභාගී වූ රාජ්‍ය අමාත්‍ය ශෙහාන් සේමසිංහ මැතිතුමා සහ අමාත්‍යාංශ ලේකම් නීල් බණ්ඩාර හපුහින්න මැතිතුමා **(2020.09.04).**







11. මහරගම ජාතික අධ්‍යාපන ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන **(2020.09.18).**







12. භික්ෂූන් වහන්සේලා සහ භික්ෂූන්වහන්සේලාගේ දෙමාපියන් සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සැකසීම වෙනුවෙන් පවත්වනු ලැබූ විශේෂ සාකච්ඡාව **(2020.09.28)**.





13. මොණරාගල දිස්ත්‍රික් ව්‍යාපාර සේවා මධ්‍යස්ථානය විවෘත කිරීමට සමගාමීව සභාපතිතුමන් විසින් ව්‍යාපාරිකයින් සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ සාමාජිකත්වය පිරිනැමීම **(2020.11.10).**





14. ශ්‍රී ලංකා නිතිඥ සංගමය හා ඒකාබද්ධව නිතිඥයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වාදීම වෙනුවෙන් පවත්වනු ලැබූ සාකච්ඡාව **(2020.11.16)**





15. මධ්‍යම පරිසර අධිකාරියේ සේවයේ නියුතු නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් එම ආයතන පරිශ්‍රයේදී පවත්වනු ලැබූ සාකච්ඡාව **(2020.12.14)**





2.7. 2020 වර්ෂයේ ප්‍රතිලාභ ගෙවීම

විස්තරය	සංඛ්‍යාව	වියදම (රු.)
විශ්‍රාම වැටුප් ගෙවීම්	31,769	331,553,954.76
මරණ පාරිතෝෂික ගෙවීම්	63	2,135,828.14
ආබාධිත පාරිතෝෂික ගෙවීම්	27	589,719.00
අතිරේක ප්‍රතිලාභ (5 වසර ශිෂ්‍යත්වය, අ.පොෂ: සා/පෙ, අ.පොෂ: උ/පෙ)	294	2,928,000.00
එකතුව	**32,153**	**337,207,501.90**

ශුද්ධ දායක මුදල් ආපසු ගෙවීම්	සංඛ්‍යාව	මුදල (රු.)
	1014	2,946,174.00

2.8. 2020 වර්ෂයේ දායකයින්ගේ අය කළ මුදල්

බදවාගැනීම් සහ වාරික රැස්කිරීම්	ලැබීම් (රු.)
බදවාගැනීමේ මුල් වාරික මුදල	45,105,716.36

2.9. 2020 වර්ෂයේ පවත්වන ලද පුහුණු හා ජංගම දැනුවත් කිරීමේ වැඩසටහන

	සංඛ්‍යාව	වැය වූ මුදල (රු.)
විශ්‍රම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රවර්ධන වැඩසටහන්	06	46,600.00

2.10. සමාජ ආරක්ෂණ අංශයේ ගැටලු

1. දිස්ත්‍රික් කාර්යාල වෙත අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය සීමිත වීම හේතුවෙන් සෘජු මැදිහත්වීම යටතේ යෝජනා ක්‍රමය පිළිබඳ දැනුවත් කිරීම, බඳවාගැනීම, වාරික රැස්කිරීම සඳහා මණ්ඩලයේ සෘජු පාලනයට යටත් නොවන නිලධාරීන්ගේ සේවය ලබාගැනීමට සිදුවීම.

2. පුහුණුව ලත් ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලය සේවයෙන් ඉවත්වීම බහුලව පැවතීම හේතුවෙන් සේවක පිරිවැටුම ඉහළ අගයක් ගෙන ඇති අතර, නව නිලධාරීන් බඳවාගැනීම හා ඔවුන් පුහුණුකර සේවයේ යෙදවීමට සිදුවීම. 2020 වර්ෂය පුරා යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් අනුයුක්ත කර ඇති සම්බන්ධීකරණ නිලධාරීන් 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුනි.

3. 2020 වර්ෂය පුරා පැවති කොවිඩ් 19 වෛරස් ව්‍යාප්තියත් සමග සංචරණ සීමා ක්‍රියාත්මක වීම, ප්‍රදේශ හුදෙකලා කිරීම, ජනතාව එක්රැස් කිරීමේ කටයුතු සමාජ දුරස්ථභාවය සහිතව සීමා කිරීමට සිදුවීම හා ජනතාවගේ ආදායම් තත්වයන් පහත වැටීම හේතුවෙන් 2020 වර්ෂයේ දී අපේක්ෂිත ඉලක්ක ලගාකර ගැනීමට අපහසුවිය.

03. මුදල් අංශය

කාර්යයභාරය

- වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම.
- වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම.
- මාසික අක්මුදල් වාර්තා පිලියල කිරීම (වාර්ෂික අයවැය ප්‍රසම්පාදන මත)
- 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන වලට අනුව වාර්ෂික මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නියමිත වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.
- මහා භාණ්ඩාගාරයට, රේඛීය අමාත්‍යාංශයට හා කළමනාකරණ කාර්යයන් සඳහා අවශ්‍ය වන මුල්‍ය වාර්තාවන් වරින් වර පිළියෙල කිරීම.
- මුදල් අංශයට අදාල සියලුම ගිණුම් යාවත්කාලීන කිරීම.
- සියලුම ගණුදෙනු වලට අදාළ බැංකු ගිණුම් ක්‍රමානුකූලව පවත්වා ගෙන යාම සහ බැංකු සැසඳුම් වාර්තා පිලියෙල කිරීම.
- මාසික විශ්‍රාම වැටුප් සහ අනෙකුත් සියලුම ගෙවීම් සිදුකිරීම සහ ගිණුම්ගත කිරීම.
- දායකයින්ගෙන් ලබාගන්නා මුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීම.
- වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදු කිරීම තුළින් ආයතනය සතු ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
- කාර්යය මණ්ඩලය සඳහා මාසිකව වැටුප් සැකසීම හා අදාළ වාර්තාවන් පිළියෙල කිරීම.
- කළමනාකරණයට අවශ්‍ය තීරණ ගැනීම සඳහා විධිමත් හා නිවැරදි තොරතුරු ලබාදීම.
- විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අදාළ සාමාජික මුදල් තැන්පතු භාර ගැනීම හා බැංකුගත කිරීම.

3.1. පොදු කරුණු

සියලු චෙක්පත් ලිවීම් ගිණුම් සැකසීමේ කාර්යයන් හා වැටුප් සැකසීම් පරිගණක ගතකර ඇත.

වාර්ෂිකව රුපියල් මිලියන 331 ක් පමණ දායකයින් වෙත විශ්‍රාම වැටුප් ගෙවනු ලබන අතර දිවයින පුරා පිහිටි සමුපකාර ග්‍රාමීය බැංකු 2000ක් තුළින් විශ්‍රාම වැටුප් ගෙවීම සිදු කෙරේ.

දැනට දිවයින පුරා පිහිටි මහජන බැංකු, ලංකා බැංකු හා ජාතික ඉතිරිකිරීමේ බැංකු තුළින් හා තැපැල් කාර්යාල මඟින් දායකයින්ගේ මුදල් එකතුවීම සිදුවේ. විදේශ රටවල සේවා නියුක්තිකයන් වෙනුවෙන් නේවාසික විදේශ මුදල් ගිණුමක් ද (RFC) මහජන බැංකුවේ ආරම්භ කර ඒ හරහා ද දායකයින්ගේ වාරික මුදල් එකතු කිරීම සිදු කෙරේ.

3.2 ආයතනය සතු වත්කම්

අනු අංකය	විස්තරය	2020.12.31 දිනට වටිනාකම (රු.)
01	ගොඩනැගිලි	88,541,347.00
02	ඉඩම්	97,050,000.00
03	මෝටර් රථ	14,610,077.00
04	කාර්යාල උපකරණ	8,361,931.00
05	පරිගණක	3,816,007.00
06	සන්නිවේදන උපකරණ	40.00
07	පරිගණක මෘදුකාංග	621,642.00
08	වෙනත්	168,435.00
09	යන්ත්‍ර උපකරණ හා කාර්යාල උපකරණ	680,321.00
	එකතුව	**213,855,800.00**

3.3 2020 වර්ෂයේ භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන

පුනරාවර්තන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2020)	වියදම (රු.)
121,777,365.00	**123,555,443.00**

ප්‍රාග්ධන

භාණ්ඩාගාරයෙන් ලද ප්‍රතිපාදන (2020)	වියදම (රු.)
400,000.00	**400,000.00**

3.4 මුදල් අංශයේ කාර්යය මණ්ඩලය

තනතුර		නිලධාරීන් සංඛ්‍යාව
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්)	-	0
සහකාර සාමාන්‍යාධිකාරි (මුදල්)	-	1
ගිණුම් නිලධාරි (මුදල්)	-	1
ගිණුම් නිලධාරි (රැස්කිරීම්)	-	1
පොත් තබන්නා	-	1
කළමනාකරණ සහකාර	-	12
කාර්යාල කාර්ය සහයක	-	2
එකතුව	-	**18**

4. අභ්‍යන්තර විගණන අංශය

4.1. විෂය පථය

- අභ්‍යන්තර පාලන ව්‍යුහය, අධිකාරීත්ව සීමාවන් හඳුනාගැනීම සහ පරිපාලන කටයුතුවල කාර්යක්ෂමතාව සහ කාර්යය මණ්ඩල කාර්ය සාධනයේ ගුණාත්මක බව ඇගයීම
- ගණුදෙනු ක්‍රියාත්මක කිරීම, මුල්‍ය පාලනය සහ අයවැය, නීති හා රෙගුලාසි වලට දක්වා ඇති අනුකූලතාව පරීක්ෂා කිරීම
- මෙහෙයුම් ක්‍රියාවලිය සහ ප්‍රවර්ධන කටයුතුවල කාර්යක්ෂම බව සහ සාර්ථකත්වය ඇගයීම.
- වත්කම්වල පාලනය සහ ආරක්ෂාව ඇගයීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව නව ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම්වල ප්‍රගතිය ඇගයීම

4.2. කාර්යයභාරය

පරිපාලන සහ මූල්‍ය කටයුතු පිළිබඳ පරීක්ෂාව

- රැකියා පිරිවිතරයන් හා රැකියා විස්තරයන් හා අනුමත සේවක සංඛ්‍යාව පරීක්ෂාව
- කාර්යය මණ්ඩල බඳවා ගැනීම් සහ පුද්ගලික ලිපිගොනු පරීක්ෂාව
- කාර්යය මණ්ඩල පැමිණීම පිටවීම සහ නිවාඩු පරීක්ෂාව
- සේවක සුබසාධනය සහ අභිප්‍රේරණ ක්‍රියාමාර්ග පරීක්ෂාව
- සේවක විනය පාලනය සහ විනය පාලන ක්‍රියාමාර්ග පරීක්ෂාව
- වාහන ධාවනය සහ නඩත්තු කටයුතු පරීක්ෂාව
- නඩත්තු කටයුතු හා සනීපාරක්ෂක සහ ආරක්ෂක සේවා කටයුතු පරීක්ෂාව
- භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම් සහ දායක වාරික මුදල් ලැබීම් පරීක්ෂාව
- ප්‍රසම්පාදන කටයුතු පරීක්ෂාව
- සියලු පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් පරීක්ෂාව
- බැංකු ගිණුම් සහ බැංකු සැසඳුම් පිළියෙළ කිරීම පරීක්ෂාව
- ආයෝජන කටයුතු පරීක්ෂාව
- ගිණුම් වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, පරීක්ෂා කිරීම

මෙහෙයුම් කටයුතු පිළිබඳ පරීක්ෂාව

- දායක බඳවා ගැනීම් හා අයදුම්පත් පරිගණක ගත කිරීම හා ඔප්පු නිකුත් කිරීම සහ පරීක්ෂාව
- වාරික අයකිරීම, ප්‍රේෂණය සහ ගිණුම් ගත කිරීම පරීක්ෂාව
- ප්‍රතිලාභ ගෙවීම් කටයුතු පරීක්ෂාව
- දායකත්වයෙන් ඉවත්වීම සඳහා ගෙවීම් පරීක්ෂාව
- ප්‍රවර්ධන කටයුතු සහ වැඩසටහන්වල ප්‍රගතිය පරීක්ෂා කිරීම

අනෙකුත් කාර්යයන්

- විශේෂ පැවරුම්
- ජාතික විගණන කාර්යාල විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම සම්බන්ධීකරණය

4.3. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැති දිනයන්

- 2020 ජුනි 29
- 2020 සැප්තැම්බර් 23
- 2020 දෙසැම්බර් 23

4.4. 2020 වර්ෂයේ දී ඉදිරිපත් කළ අභ්‍යන්තර විගණන වාර්තා

	අභ්‍යන්තර විගණන වාර්තා විෂයය	ඉදිරිපත් කළ දිනය
01	මෙහෙයුම් ක්‍රියාවලිය තුලින් ජනනය වූ මුදල් ප්‍රවාහය - විශ්ලේෂණය	2020.01.09
02	දායක බඳවාගැනීම් හා පරිගණකගත කිරීම	2020.01.03
03	වාර්ෂික සැලසුම් සකස්කිරීම	2020.02.03
04	ස්ථාවර වත්කම් පාලනය	2020.02.07
05	එපික් ලංකා (පුද්) සමාගමට පවරා ඇති පරිගණක පද්ධතිය සකස්කර ස්ථාපිත කිරීම	2020.03.04
06	ආයෝජන	2020.06.24
07	බැංකු සැසඳුම් සහ හදුනානොගත් තැන්පතු	2020.07.22
08	කලාකරු විශ්‍රාම වැටුප් ක්‍රමය	2020.08.31
09	දායක බඳවාගැනීම් හා ඔප්පු නිකුත්කිරීම්	2020.09.15
10	එස් එස් බී 02 කුවිතාන්සි පොත් භාවිතය	2020.11.25
11	ස්වාධීන අලෙවි ප්‍රවර්ධනය ජාලය ක්‍රියාත්මක කිරීම	2020.11.25

- **දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව**

	දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	වාර්තාව ඉදිරිපත් කල දිනය
01	ගාල්ල දිස්ත්‍රික් කාර්යාල පරීක්ෂාව	2020.05.28

- **ඉදිරිපත් කළ වෙනත් වාර්තා**

1. අධ්‍යක්ෂක මණ්ඩලය විසින් පවරන ලද විශේෂ පැවරුම් වාර්තා
   (සාමාන්‍යාධිකාරී විසින් ලිපිගොනු රඳවා තබාගැනීම පිළිබඳ වාර්තාව)
2. 2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාවල වර්තමාන ප්‍රගතිය පිළිබඳ වාර්තා

4.5. අභ්‍යන්තර විගණන අංශයේ කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී සංඛ්‍යාව
අභ්‍යන්තර විගණක	01
විගණන නිලධාරී	02
විමර්ශන නිලධාරී	01
එකතුව	**04**

ස්තූතිය

රාජ්‍ය විශ්‍රාම වැටුප් හිමිකම නොමැති තැනැත්තන්ගේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සමය වඩාත් සුරක්ෂිත කිරීම සඳහා විශ්‍රාම වැටුප් රැකවරණය සැලසීම හා වෙනත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම සඳහා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාවට නංවා ඇත. එම කාර්යයභාරය ඉටුකිරීමේ දී පරිපාලන මෙහෙයුම් සම්බන්ධීකරණය ආදි සෑම අංශයකින්ම සහය දක්වන ලද සැමට ස්තූතිය ප්‍රකාශ කරමු.

- මුදල් අමාත්‍යාංශය
- සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
- ජාතික විගණන කාර්යාලය
- රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
- දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශිය ලේකම්වරුන්
- සමාජ සේවා නිලධාරින්, ග්‍රාම නිලධාරින්
- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව
- තැපැල් දෙපාර්තමේන්තුව
- සමූපකාර ග්‍රාමීය බැංකු ජාලය
- විවිධ අයුරින් සහය දක්වන ලද සැමට

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

සමාජ ආරක්ෂණ පියස

අංක 18, රාජගිරිය පාර,

රාජගිරිය.

2020

අවසන් ගිණුම්



ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

''සමාජ ආරක්ෂණ පියස''
නො : 18, රාජගිරිය පාර,
රාජගිරිය.

ක්ෂණික ඇමතුම්	: 0112 88 60 88
දුරකතන	: 0112 88 65 85/86
වෙබ් අඩවිය	: www.ssb.gov.lk
ඊ-මේල්	: info@ssb.gov.lk

පටුන පිටු අංකය

ගිණුම්කරණ ප්‍රතිපත්ති 01-05

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 06-06

මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය 07-07

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය 08-08

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය 09-09

මූල්‍ය කාර්ය සාධනය සඳහා සටහන් 10-12

මූල්‍ය තත්ත්වය සඳහා සටහන් 12-18

ආයෝජන ලේඛනය 19-19

සමාජ ආරක්ෂණ මණ්ඩල අරමුදල සඳහා ආදායම් සහ වියදම් අරමුදල 20-20

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන්

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. සංස්ථාමය තොරතුරු

1.1 වාසස්ථාන සහ නෛතික ආකෘතිය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව මගින් වර්ෂ 1996 අංක 17 දරණ පනත මගින් ස්ථාපිත කරන ලදුව, වර්ෂ 1999 අංක 33 දරණ පනත මගින් එම මුල් පනත සංශෝධනය කර ඇත. මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය යටතට පත්වීමත් සමඟ වර්තමානයේදී එහි සේවා කටයුතු තව දුරටත් පුළුල් වී තිබේ. මෙහි ප්‍රධාන කාර්යාලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය යන ස්ථානයේ ස්ථාපනය කර ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම් නොමැති තැනැත්තන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම සඳහා මාසික විශ්‍රාම වැටුප් ලබා දීම, හදිසි අකර්මන්‍යතාවයන්හිදී හා මරණයේදී මූල්‍ය සහනය ලබා දීම සඳහා, විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. රජයේ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව ක්‍රියාවට නගමින් රාජ්‍ය විශ්‍රාම වැටුපක හිමිකම නොමැති පුරවැසියන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සහතික කිරීම ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ කාර්යය භාරය වේ.

1.3 සේවකයින් සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට සිටි සේවකයන් සංඛ්‍යාව වනුයේ 154 කි.

2. පිළියෙළ කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශයන්ට ඇතුළත් වනුයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශයන්ට අදාල සටහන් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කරනු ලබන්නේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ඉදිරිපත් කර තිබෙන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන්ට අනුකූලවය. (SLPSAS)

2.2. මිනුම් කිරීමේ පදනම

ඓතිහාසික පිරිවැය ප්‍රඥප්තිය පදනම් කර ගනිමින් මෙම මූල්‍ය ප්‍රකාශයන් සකස් කොට තිබේ. ගිණුම් කෙරෙහි බලපාන උද්ධමනකාරී කරුණු සැලකිල්ලට ගෙන ඒවා වෙනස් කර නොමැත.

2.3 මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ ඉදිරිපත් කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කොට ඇති අතර ඒවා ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ක්‍රියාකාරී මුදල් වේ.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මෙම මූල ප්‍රකාශ වල දක්වා ඇති සියලු කාල සීමා වලට ඒකාකාරව අනුකූලව වන පරිදි යොදා ගෙන තිබේ.

3.1. දේපල, යන්ත්‍ර සහ උපකරණ

දේපල, යන්ත්‍ර සහ උපකරණ වල පිරිවැය යනුවෙන් දක්වනුයේ එහි අරමුණුගත කාර්යය සඳහා වත්කම් අත්කර ගැනීම සහ හෝ ඉදිකිරීමේ වියදම් පමණක් නොව වත්කම් ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා දරනු ලබන ඕනෑම වියදමක්ද ඇතුළත් පිරිවැයකි. පිරිවැය වශයෙන් වත්කමක් මුලිකව හඳුනා ගැනීමෙන් පසුව වත්කම් ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබනුයේ එහි පසුකාලීනව සිදු විය හැකි ඕනෑම ක්ෂයවීමක් අඩු කළ ප්‍රති තක්සේරු කිරීම් කරනු ලබන ප්‍රමාණයකට වේ. අනිකුත් සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ. දේපළ, පිරියත හා උපකරණ අයිතමයන් වල විවිධ ප්‍රයෝජන සහිත ප්‍රධාන කොටස් අඩංගු වේ, ඒවා දේපල, බලාගාර හා උපකරණ අයිතමය වශයෙන් ලෙස වෙන් වෙන්ව ගණනය කරනු ලැබේ.

එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේ දී, අදාළ වන්නේ නම් වත්කම් වල ශේෂ වටිනාකම්, ප්‍රයෝජනවත් ආයු කාලය හා ක්ෂය වීම් ක්‍රම ඒවා අදාළ වන්නේ නම් සමාලෝචනය කර ගැලපුම් කර ලබා දී තිබේ.

ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ

කිසියම් ප්‍රදානයක් ලෙස අත්පත් වන දේපල, යන්ත්‍ර සහ උපකරණ පිරිවැය යටතේ ප්‍රාග්ධනිකරණය කෙරේ.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සහ වෙනත් සින්නක්කර ඉඩම් දක්වා තිබෙනුයේ සමුච්චිත ක්ෂය කිරීම් අඩුකළ පිරිවැය ලෙස වේ. සින්නක්කර ඉඩම් වල පිරිවැය ප්‍රකාශිත වේ.

ඇස්තමේන්තුගත ආයු කාලයට වඩා පිරිවැය කපා හැරීම සඳහා සින්නක්කර ඉඩම් හැර වෙනත් සියලු දේපල, පිරිස් සහ උපකරණ මත ක්ෂය වීමක් අය කෙරේ.

අනුපාතික පදනම මත වර්ෂය සඳහා ක්ෂයවීම් ලබා දී ඇත.

දේපල, යන්ත්‍ර සහ උපකරණ සඳහා ප්‍රතිපාදන ගණනය කරනු ලබන්නේ පහත දක්වා ඇති පරිදි සෘජු රේඛා ක්‍රමය පදනම් කොට ගෙන වේ. එසේම, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගණකාධිකාරී ප්‍රමිතීන් වල දක්වා ඇති පරිදි සියළුම දේපල, යන්ත්‍ර සහ උපකරණ වල ක්ෂයවීම ගණනය කර ඇත්තේ පිරිවැය ක්‍රමය යටතේ වේ **(SLPSAS 7)**

1. **මෝටර් රථ**	20%
2. **දේපල, යන්ත්‍ර සහ උපකරණ**	25%
3. **පරිගණක සහ වෙනත් ස්ථාවර වත්කම්**	25%
4. **සන්නිවේදනය**	20%
5. **ලී බඩු සහ කාර්යාලීය උපකරණ**	10%
6. **ගොඩනැගිලි**	4%
7. **වෙනත්**	10%.
8. **මෘදුකාංග**	25%

බැහැර කරනු ලබන හෝ ඒවා බැහැර කිරීමෙන් හෝ භාවිතා කිරීමෙන් අනාගත ආර්ථික වටිනාකමක් හෝ අපේක්ෂා කළ නොහැකි ඒකක ආර්ථික වටිනාකමක් නොමැති දේපල, යන්ත්‍ර සහ උපකරණ යටතට දක්වනු ලැබේ. (මෙලෙස ආර්ථික වටිනාකමක් නොමැතිව බැහැර කරනු ලබන දේපලක යම්කිසි ලැබීමක් හෝ අහිමි වීමක් ගණනය කරනුයේ ශුද්ධ බැහැර කිරීමේ ඉපැයීම් අතර වෙනස වශයෙන් අතර දෙපළ බැහැර කරනු ලබන වර්ෂයේ ආදායම් ගිණුමේ මෙම අගය දක්වා ඇත.

මුල් තක්සේරුගත කාර්යසාධන ප්‍රමිතිය තුලින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ පවත්වා ගැනීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා දේපල, යන්ත්‍ර සහ උපකරණ පවත්වා ගැනීම හෝ අළුත්වැඩියා කිරීම මත වැයවන වනුයේ පිරිවැයක් ලෙස හඳුනා ගැනේ.

3.2 ඉන්වෙන්ට්‍රි

මූල්‍ය වර්ෂය තුළදී භාවිතා කළ ඉන්වෙන්ට්‍රි, ආදායම් හා වියදම ප්‍රකාශයේ දක්වා ඇත.

තොග ශේෂ තක්සේරු කරනුයේ පිරිවැය, විකුණුම් මිල හෝ ශුද්ධ උපලබ්ධි කළ හැකි අගයෙන් වඩා අඩු අගය ඇති දර්ශකය මත වේ.

3.3. කෙටිකාලින ආයෝජන

වසරකට වඩා අඩු කල්පැවැත්මක් සහිත මුදල් වෙලඳපොල ආයෝජනයන් කෙටි කාලීන ආයෝජන ලෙස සලකනු ලබන අතර පිරිවැය ලෙස දක්වනු ලැබේ.

3.4. මුදල් සහ මුදල් වලට සමාන දෑ

මේ යටතට ගැනෙනුයේ අත ඇති මුදල් සහ බැංකු තැන්පතු වේ.

3.5. මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය සකසා තිබෙනුයේ අනියම් ක්‍රමයකට වේ.

3**.6. බැරකම් සහ ප්‍රතිපාදන**

ශේෂ පත්‍රයේ වත්මන් බැරකම් යටතේ සඳහන් කර ඇති බැරකම් ශේෂ පත්‍රයේ දිනයෙන් වර්ෂයක් ඇතුළත අයවීමට අපේක්ෂිත පසුගිය සිදුවීමක ප්‍රතිඵලයක් වන අතර මෙම අයවීම් නිරවුල් වීම තුළින් ආර්ථික ප්‍රතිලාභ රැගත් සම්පත් පිටතට ගලා යෑමක් අපේක්ෂා කෙරේ. ණය හිමියන්ගේ ඉල්ලීම මත ගෙවිය යුතු ගෙවීම් හෝ ශේෂ පත්‍රයේ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු ගෙවීම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් ලෙස සැලකේ.

පසුගිය අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට වර්තමානයේදී නීත්‍යානුකූල හෝ සම්ප්‍රයුක්ත බැඳීමක් අතිවීමකදී එලෙස ඇතිවූ බැඳීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත්වන සම්පත් පිටාර ගැලීමක් අවශ්‍ය විය හැක

3.7. බදු අය කිරීම

වර්ෂ 2006 අංක 10 දරණ දේශීය අදායම් පනතේ විධිවිධාන සහ එකී පනතට සිදුකරනු ලබන සංශෝධනය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන සකස් කොට තිබේ.

3.8 සේවක ප්‍රතිලාභ

I. දායක මුදල් සැලැස්ම අර්ථ දැක්වීම.

දායක මුදල් සැලැස්මේ බැඳීම්, ආදායම් ප්‍රකාශනයේ දැරිය යුතු වියදම් ලෙස හඳුනා ගැනේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අර්ථසාධක අරමුදල් සඳහා 12% ක් සහ භාරකාර අරමුදල් සඳහා සේවකයින්ගේ දළ වැටුපෙන් 3% ක්ද වන පරිදි දායකත්වය ලබාදේ.

II. ප්‍රතිලාභ සැලැස්ම අර්ථ දැක්වීම

ප්‍රතිලාභ සැලැස්ම යනු පාරිතෝෂිකය වේ. ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය අදාළ ප්‍රඥප්තිය අනුව පාරිතෝෂික ගෙවීමට වග බලා ගත යුතුය. මෙම වගකීම් පූර්ණය කිරීම සඳහා,ප්‍රතිපාදන ශේෂ පත්‍රයේ ඉදිරියට රැගෙන එනු ලබන අතර එය සේවයේ පළමු වසරේ සිට ආරම්භ කරන සෑම සේවක වර්ෂයක් සඳහාම සියළුම සේවකයින්ගේ මූල්‍ය වර්ෂයේ අර්ධ මාසයක වැටුප ගණනය කරන ලද මුදලකට සමාන වේ.

වර්ෂ 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික ගෙවිය හැකි සියළුම සේවකයන් වෙත විශ්‍රාම පාරිතෝෂික ලබා දෙනු පිණිස ප්‍රතිපාදන සලසා ඇත. මෙම අයිතමය ශේෂ පත්‍රයෙහි නොගෙවූ වගකීම් යටතේ වර්ගීකරණය කර ඇත.

භාණ්ඩාගාරයට අනුව, අවශ්‍ය වන විට අරමුදල් ප්‍රදානය කරන බැවින් අරමුදල් අවශ්‍ය නොවේ.

3.9. ආදායම් හඳුනා ගැනීම

3.9.1 ආදායම් හඳුනා ගැනීම

බදවාගැනීමේ ගාස්තු සහ දායකයින්ගේ වාරික ගිණුම් ගත වනුයේ මුදල් පදනම මත වන අතර පොලී ආදායම් සහ අනිකුත් සියළුම ආදායම් උපචිත පදනමින් ගිණුම්ගත වේ

3.9.2 වියදම්

මණ්ඩලය පවත්වා ගැනීම සඳහා වැයවන සියළුම මුදල් උපචිත පදනමින් ගිණුම්ගත වන අතර ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ ආදායම් ධාරිතාවය එලෙස පැවතීම හෝ ආදායම් ධාරිතාවය වැඩි කිරීම අරමුණු කොට ගෙන ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, පුළුල් කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා වැයවන මුදල් ප්‍රාග්ධන වියදම් ලෙස හැඳින්වේ.

3.10. සංඝන්දනාත්මක තොරතුරු

අවශ්‍ය අවස්ථාවලදී, වත්මන් වර්ෂයේ ඉදිරිපත් කිරීම සඳහා අනුකූලව සංඝන්දනාත්මක සංඛ්‍යා නැවත සකස් කර ඇත.

3.11. ශේෂ පත්‍රයේ දිනට පසු සිදුවන සිදුවීම්

සියළු ද්‍රව්‍ය පශ්චාත් ශේෂ පත්‍ර පිළිබඳ සිදුවීම් සලකනු ලබන අතර ගිණුම් ප්‍රකාශනයේ අදාළ සටහනට සුදුසු පරිදි ගැලපීම හෝ අනාවරණය කිරීම් සිදු කර ඇත.

3.12. බැඳීම් සහ අවිනිශ්චිත ප්‍රතිපාදන

අතීත සිදුවීම් වලින් ඇතිවිය හැකි වත්කම් හෝ බැඳීම් අවිනිශ්චිත ප්‍රතිපාදන යටතට ගනු ලබන අතර ඒවා නිශ්චිත වනුයේ ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයට පාලනය කළ නොහැකි අවිනිශ්චිත අනාගත සිදුවීම්වල සිදුවීම හෝ සිදු නොවීම මත පමණි.

3.13. ප්‍රදානයන් ගිණුම්ගත කිරීම

i. රාජ්‍ය ප්‍රදාන

ඉදිරිපත් කිරීමේ ක්‍රම ඇතුළුව රාජ්‍ය ප්‍රදාන සඳහා අනුගත ගිණුම්කරණ ප්‍රතිපත්තිය පහත දැක්වේ.

අ. වත්කම් මිලදී ගැනීමට යෙදෙන රජයේ ප්‍රදානයන් වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය සඳහා ආදායම ලෙස පිළිගනු ලැබේ.

ආ. අරමුදල් සහ වියදම් තුලින් ලැබුණු අනිකුත් ප්‍රදාන ලාභ සහ අලාභ වලට ඇතුළත් කොට තිබේ.

3.14.1 ආයෝජන

ස්ථාවර තැන්පතුව හා කෙටි කාලීන තැන්පතුවල ආයෝජනයන් පිරිවැය මත ප්‍රකාශ කර ඇත. එම ආයෝජන වල ආදායම් උපචිත පදනමින් ගිණුම්ගත කර ඇත.

.

	NOTE	2020 (රු.)	2019 (රු.)
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ බැංකු මුදල්	9	27,094,773	14,678,445
ආයෝජන	10	76,000	76,000
අත්තිකාරම්	11	50,725	26,770
කාර්ය මණ්ඩල ණය	12	10,936,230	11,717,395
වෙනත් වත්කම්	13	669,516,323	468,453,672
මුළු ජංගම වත්කම්		**707,674,052**	**494,952,282**
ජංගම නොවන වත්කම්			
ආයෝජන	14	1,860,252,676	1,982,009,885
දේපල,පිරියත සහ උපකරණ	15	213,855,801	200,860,251
මුළු ජංගම නොවන වත්කම්		**2,074,108,477**	**2,182,870,136**
මුළු වත්කම්		2,781,782,529	2,677,822,417
අඩුකලා :			
වගකීම්			
ජංගම වගකීම්			
වෙනත් වගකීම්	16	58,606,756	59,168,139
මුළු ජංගම වගකීම්		**58,606,756**	**59,168,139**
ශුද්ධ ජංගම වත්කම්		**649,067,296**	**435,784,142**
ජංගම හා ජංගම නොවන වගකීම්	17	32,625,648	28,223,812
මුළු වගකීම්		**91,232,404**	**87,391,951**
මුළු ශුද්ධ වත්කම්		2,690,550,125	2,590,430,467
මූල්‍ය සම්පාදනය කරනුයේ			
සමුච්චිත අරමුදල	18	(50,072,636)	(39,282,738)
ප්‍රත්‍යාගණන සංචිත	19	42,792,509	19,479,200
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදල	20	2,492,353,672	2,405,497,232
වැඩිහිටි අරමුදල් ගිණුම	21	1,174,509	1,334,700
රාජ්‍ය සහ අරමුදල් ප්‍රදාන	22	204,302,072	203,402,072
		2,690,550,125	2,590,430,467

"පිටු අංක 1 සිට 5 දක්වා දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති සහ පිටු අංක 10 සිට 17 දක්වා දක්වා ඇති සටහන් තුළින් මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂක මණ්ඩලය සතු වේ. මෙම මූල්‍ය ප්‍රකාශන, අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ."

ඩබ්.ඇම්පී.ප්‍රනාන්දු	කේ.ඒ.එස්.පී කළුආරච්චි	කේ.එම්.කුමාරසිරි	සමන් හඳුරාගම
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)	සාමාන්‍යාධිකාරී	අධ්‍යක්ෂ	සභාපති

ඩබ්.ඇම්පී.ප්‍රනාන්දු
සහකාර සාමාන්‍යාධිකාරී (මුදල්)
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
අංක. 18, රාජගිරියපාර,

කේ.ඒ.එස්.පී. කළුආරච්චි
සාමාන්‍යාධිකාරී
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
අංක. 18, රාජගිරියපාර,
රාජගිරිය.

කේ. එම්. කුමාරසිරි
නියෝජ්‍ය අධ්‍යක්ෂ
රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශය
2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

	NOTE	2020 (රු.)	2019 (රු.)
ආදායම	1	122,772,562	151,689,892
මුළු ආදායම		**122,772,562**	**151,689,892**
මෙහෙයුම් වියදම්			
පුද්ගල පඩිනඩි	2	96,796,137	105,139,922
ගමන් වියදම්	3	733,780	1,873,751
සැපයුම් හා පාරිභෝගික භාණ්ඩ	4	4,726,064	7,497,815
නඩත්තු	5	2,582,193	3,662,683
ගිවිසුම්ගත සේවා	6	17,340,218	20,801,510
වෙනත් වියදම්	7	1,377,052	6,522,298
ක්ෂය වීම්	8	11,258,357	12,839,445
මුළු වියදම්		**134,813,800**	**158,337,422**
අදාළ කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය/ හිඟය		**(12,041,238)**	**(6,647,530)**

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

2020.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශය

මෙහෙයුම් කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය	2020 (රු.)	2019 (රු.)
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	(12,041,238)	(6,647,530)
අඩුකළා :		
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් ලාභය	(11,747)	(16,556)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය කිරීම	-	(10,473,037)
පෙර වර්ෂයේ ගැලපුම්	1,251,339	579,368
එකතු කළා වර්ෂය සඳහා ක්ෂය වීම්	11,258,357	12,839,445
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	4,795,056	7,591,673
ක්‍රියාකාරී මූලධන වලට පෙර මෙහෙයුම් හිඟය	**5,251,767**	**3,873,363**
ඉන්වෙන්ට්‍රි වැඩි කිරීම	725,971	(607,257)
වෙළඳ හා අනෙකුත් ලැබීම් අඩුවීම	(201,007,458)	(208,655,837)
පෙර ගෙවීම් වැඩි කිරීම	(23,955)	(26,770)
උපචිත වියදම් හා ගෙවිය යුතු අඩුවීම්	(561,384)	12,398,141
වර්ෂය තුළ ගෙවූ පාරිතෝෂිකය	(393,220)	(1,166,588)
	(201,260,046)	**(198,058,312)**
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**(196,008,279)**	**(194,184,949)**
ආයෝජන කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය		
ස්ථාවර වත්කම් මිලදී ගැනීම	(951,794)	(13,560,213)
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලත් මුදල්	22,945	25,073
ආයෝජන	121,757,208	50,536,417
ආයෝජන කාර්යයන්ගෙන් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**120,828,359**	**37,001,277**
මූල්‍ය කාර්යයන්ගෙන් මූල්‍ය ප්‍රවාහය		
විශ්‍රාම වැටුප් අරමුදලේ වැඩිවීම	87,196,248	127,782,880
ප්‍රාග්ධන ප්‍රධාන	400,000	12,980,000
මූල්‍ය කටයුතු වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	**87,596,248**	**140,762,880**
භාවිතා කළ ශුද්ධ මුදල්	**12,416,328**	**(16,420,791)**
01/01/2020 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	14,678,445	31,099,236
31/12/2020 දිනට මුදල් සහ මුදල් සමාන දෑ	27,094,773	14,678,445

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

31.12.2020 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

	අරමුදල්	ප්‍රදාන	සමුච්චිත අරමුදල සහ සංචිත	එකතුව
2019 ජනවාරි 01 දිනට ශේෂය	2,281,814,653	197,440,666	(27,603,919)	2,451,651,400
පූර්ව වර්ෂ ගැලපීම්	3,318,180	-	14,447,912	17,766,092
වසර තුළ මාරු කිරීම	121,699,098	5,961,406	(6,647,530)	121,012,974
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,406,831,931**	**203,402,072**	**(19,803,537)**	**2,590,430,466**
2020 ජනවාරි 01 දිනට ශේෂය	2,406,831,931	203,402,072	(19,803,537)	2,590,430,466
පූර්ව වර්ෂ ගැලපීම්	2,794,706	-	24,564,649	27,359,355
වසර තුළ මාරු කිරීම	83,901,542	900,000	(12,041,238)	72,760,304
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,493,528,179**	**204,302,072**	**(7,280,126)**	**2,690,550,125**

සටහන්

සටහන 01 අදායම්	2020 රු.	2019 රු.
1.1 - පොලී ආදායම සටහන් අංක 01 (I)	901,939	1,023,482
1.2 - ප්‍රදාන සටහන් අංක 01 (II)	121,777,365	139,991,052
1.3 - වෙනත් ආදායම් සටහන් අංක 01 (III)	93,259	10,675,358
මුළු ආදායම්	122,772,562	151,689,892

සටහන 01 (I) ආදායම්	2020 රු.	2019 රු.
1.1 - පොලී ආදායම්		
අපදා ණය (I) පොලී	94,037	107,125
විශේෂ අත්තිකාරම් පොලී	3,397	3,670
වෙනත් ආදායම් - පොලී	130,607	323,933
INTREST - INCOME SYSTEM	673,898	588,754
මුළු ආදායම්	901,939	1,023,482

සටහන 01 (II) ආදායම්	2020 රු.	2019 රු.
1.2 - ප්‍රදාන		
රජයේ ප්‍රදාන - පුනරාවර්තන	121,777,365	134,503,000
TRANSFER ACCOUNT A/C 213	-	5,488,052
මුළු ආදායම්	121,777,365	139,991,052

සටහන 01 (III) ආදායම්	2020 රු.	2019 රු.
1.3 - වෙනත් ආදායම්		
විවිධ ආදායම්	81,511	185,765
ගර්භිත හා ප්‍රාග්ධන භාණ්ඩ විකිණීම්	11,747	16,556
ප්‍රමාද වූ ආදායම්	-	10,473,037
මුළු ආදායම්	93,259	10,675,358

සටහන 02 පුද්ගල වියදම් -පුද්ගල පඩිනඩි	2020 රු.	2019 රු.
වැටුප් හා වේතන	77,267,873	80,290,273
EPF	9,273,310	9,469,296
ETF	2,315,256	2,367,087
අනිකාල සහ නිවාඩු දින වැටුප්	745,737	1,369,441
වෙනත් දීමනා	2,398,905	3,237,877
පාරිතෝෂික	4,795,056	8,405,947
එකතුව	96,796,137	105,139,922

සටහන 03 ගමන් වියදම්	2020 රු.	2019 රු.
ගමන් වියදම් - දේශීය	733,780	1,418,178
ගමන් වියදම් - විදේශීය	-	455,573
එකතුව	733,780	1,873,751

සටහන 04 සැපයුම් සහ පාරිභෝගික භාණ්ඩ	2020 රු.	2019 රු.
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	3,301,978	5,406,614
ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	860,940	1,338,117
සංග්‍රහ වියදම්	241,575	312,288
පුවත්පත්	4,870	7,760
නිල ඇඳුම්	136,000	172,000
වෙනත් සැපයුම්	180,701	261,035
එකතුව	4,726,064	7,497,815

සටහන 05 නඩත්තු	2020 රු.	2019 රු.
නඩත්තු වියදම් - ගොඩනැගිලි සහ අළුත්වැඩියා	324,446	143,672
නඩත්තු වියදම් - යන්ත්‍රෝපකරණ හා කාර්යාල උපකරණ	1,610,985	1,580,308
නඩත්තු වියදම් - වාහන	646,761	1,938,702
එකතුව	2,582,193	3,662,683

සටහන 06 කොන්ත්‍රාත්කුමය / ගිවිසුම්ගත සේවා	2020 රු.	2019 රු.
ප්‍රවාහන	15,785	26,188
විදුලි සංදේශ	2,433,888	2,794,685
නැපැල් ගාස්තු	1,813,736	2,940,034
විදුලිය සහ ජලය	2,534,823	2,881,752
පිරිසිදු කිරීමේ ගාස්තු	954,405	903,160
ආරක්ෂක ගාස්තු	1,320,812	1,588,778
දැන්වීම්	893,507	1,530,587
කුලී සහ දේශීය බදු	100,887	112,300
විගණන ගාස්තු	300,000	-
මෙහෙයුම් කල්බදු වාහන මිලදී ගැනීමේ කුලී	6,972,375	8,024,025
එකතුව	17,340,218	20,801,510

සටහන 07 වෙනත් වියදම්	2020 රු.	2019 රු.
ප්‍රවර්ධන වියදම්	1,289,347	3,645,670
වෙනත් පුනරාවර්තන වියදම්	87,706	2,670,839
රැඳවුම් බද්ද	-	205,788
එකතුව	1,377,052	6,522,298

සටහන 08 ක්ෂය වීම	2020 රු.	2019 රු.
ගොඩනැගිලි	3,471,772	6,401,898
මෝටර් රථ	3,732,400	2,805,815
පරිගණක	1,861,751	1,778,552
ලී බඩු සහ කාර්යාලීය උපකරණ	1,503,434	1,385,794
මෘදුකාංග වැඩිදියුණු කිරීම	374,010	340,462
සන්නිවේදන	928	1,460
යන්ත්‍ර සහ බලාගාර	245,852	57,253
වෙනත්	68,210	68,210
එකතුව	11,258,357	12,839,445

සටහන 09 අත ඇති සහ බැංකු මුදල්	2020 රු.	2019 රු.
PB - C/A - 174100120350213	4,752,106	955,682
PB - C/A - 174100140350212	(15,678,454)	(8,963,994)
PB - S/A - USD - 174402140350212	10,261	9,781
PB - JANAJAYA CALL DEPOSITS - 174200210350	27,962,809	15,275,071
BOC - C/A - 228073	(159,000)	51,000
BOC - CALL DEPOSITS - 3532598	8,512,299	3,035,432
NSB - S/A - 101110107557	57,825	2,181,101
PB - 174100230350212	1,636,927	2,134,371
එකතුව	27,094,773	14,678,445

සටහන 10 තැන්පතු	2020 රු.	2019 රු.
ආපසු ලබාදෙන තැන්පතු - ඉන්ධන	75,000	75,000
ආපසු ලබාදෙන තැන්පතු - වෙනත්	1,000	1,000
එකතුව	76,000	76,000

සටහන 11 අත්තිකාරම්	2020 රු.	2019 රු.
කැපැල්	50,725	26,770
එකතුව	50,725	26,770

සටහන 12 කාර්ය මණ්ඩල ණය	2020 රු.	2019 රු.
ආපදා ණය 1	1,873,192	1,850,372
ආපදා ණය 2	230,680	260,244
ආපදා ණය 3	8,807,859	9,592,279
උත්සව අත්තිකාරම්	24,500	14,500
විශේෂ අත්තිකාරම්	-	-
එකතුව	10,936,230	11,717,395

සටහන 13 වෙනත් වත්කම්	2020 රු.	2019 රු.
ලැබිය යුතු පොලිය - ස්ථිර තැන්පතු	642,256,252	446,243,886
ලැබිය යුතු පොලිය - ස්ථිර තැන්පතු සංස්කෘතික	23,235,487	17,531,493
INTEREST RECIVABLE SYSTEM	90,990	41,092
කොගය	2,404,898	3,130,869
ලැබිය යුතු කාර්ය මණ්ඩල ලැබීම්	1,252,912	1,335,805
රක්ෂණ පෙර ගෙවුම්	135,487	170,526
කුලී සහ බදු පෙරගෙවුම්	102,366	-
INTEREST RECIVABLE JALAYA	37,932	-
එකතුව	669,516,323	468,453,672

සටහන 14 ආයෝජන	2020 රු.	2019 රු.
ආයෝජන -ස්ථාවර තැන්පතු	1,741,510,030	1,870,775,003
ආයෝජන - සංස්කෘතික	102,832,557	99,139,357
ආයෝජන - මෘදුකාංග	12,910,088	12,095,524
ආයෝජන - ජාලය	3,000,000	-
එකතුව	1,860,252,676	1,982,009,885

15 සටහන

සමාජ ආරක්ෂණ මණ්ඩලය

2020 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්

විස්තරය	ගොඩනැගිලි	මොටර් රථ	ලී බඩු සහ කාර්යාලිය උපකරණ	පරිගණක	සන්නිවේදන	බලාගාර සහ යන්ත්‍රෝපකරණ	මෘදුකාංග	වෙනත්	ඉඩම්	එකතුව
	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු	රු
2020 ජනවාරි 01 දිනට වියදම	161,241,180	18,662,000	24,242,302	28,994,842	4,737,540	10,945,387	25,491,318	1,066,105	47,854,000	323,234,673
ප්‍රත්‍යාගණනය	74,449,000	-	-	-	-	-	-	-	97,050,000	171,499,000
මාරු කිරීම් (FROM REVALUATION ADJ)	138,151,000	-	-	-	-	-	-	-	47,854,000	186,005,000
එකතු කිරීම්	911,244	-	5,950	34,600	-	-	-	-	-	951,794
බැහැර කිරීම්	-		227,147		-	-	-	-	-	227,147
2020 දෙසැම්බර් 31 දිනට වියදම	98,450,424	18,662,000	24,021,104	29,029,442	4,737,540	10,945,387	25,491,318	1,066,105	97,050,000	309,453,320
2020 ජනවාරි 01 දිනට සමුච්චිත ක්ෂය වීම්	44,256,615	313,523	14,371,689	23,351,684	4,736,572	10,019,214	24,495,667	829,460	-	122,374,422
මාරු කිරීම් (FROM REVALUATION ADJ)	37,819,309	-	-	-	-	-	-	-		37,819,309
ප්‍රත්‍යාගණනය	-	-	-	-	-	-	-	-	-	-
එකතු කිරීම්	3,471,772	3,732,400	1,503,434	1,861,751	928	245,852	374,010	68,210	-	11,258,357
බැහැර කිරීම්	-	-	215,950	-	-	-			-	215,950
2020 දෙසැම්බර් 31 දිනට සමුච්චිත ක්ෂයවීම	9,909,077	4,045,923	15,659,173	25,213,435	4,737,500	10,265,066	24,869,676	897,670	-	95,597,520
2020 ජනවාරි 01 දිනට W.D.V	116,984,565	18,348,477	9,870,613	5,643,158	968	926,173	995,652	236,645	97,050,000	200,860,251
2020 දෙසැම්බර් 31 දිනට W.D.V	88,541,347	14,616,077	8,361,931	3,816,007	40	680,321	621,642	168,435	97,050,000	213,855,801

සටහන 16 වෙනත් වගකීම්	2020 රු.	2019 රු.
උපචිත වියදම් - වෙනත් දීමනා	63,000	143,500
උපචිත වියදම් - ඇනිකාල	81,547	90,627
උපචිත වියදම් - ගමන් වියදම්	63,844	157,517
උපචිත වියදම් - ලිපිදුව්‍ය	577,997	75,095
උපචිත වියදම් - ඉන්ධන	44,294	111,195
උපචිත වියදම් - වෙනත් සැපයුම්	210,496	1,620
උපචිත වියදම් - වාහන නඩත්තු	1,150	101,600
උපචිත වියදම් - යන්ත්‍ර සහ බාලාගාර නඩත්තුව	30,530	31,000
උපචිත වියදම් - ප්‍රවාහන	5,475	-
උපචිත වියදම් - විදුලි සංදේශ	215,803	305,626
උපචිත වියදම් - තැපැල් ගාස්තු	14,902	11,093
උපචිත වියදම් - ජලය සහ විදුලිය	244,688	260,943
උපචිත වියදම් - වෙනත් ගිවිසුම්ගත සේවා	1,691,994	964,537
උපචිත වියදම් - ETF	825	-
උපචිත වියදම් - වැටුප්	35,373	-
උපචිත වියදම් - පාරිතෝෂික ගෙවීම්	103,560	656,931
උපචිත වියදම් - EPF	5,497	-
උපචිත වියදම් - විගණන ගාස්තු	649,140	850,080
උපචිත වියදම් - රැදවුම් බදු	33,104,517	33,823,839
උපචිත වියදම් -රදවාගැනීමේ ගැනීමේ බදු ගෙවිය යුතු - සංස්කෘතික	1,384,373	1,395,714
උපචිත වියදම් - මෙහෙයුම් කල්බදු වාහන මිලදී ගැනීමේ කුලී	580,000	610,400
උපචිත වියදම් - වෙනත් පුනරාවර්තන	439,928	1,067,449
උපචිත වියදම්- නිවාඩු දින	-	11,333
ගෙවිය යුතු දිරි දීමනා	8,265,632	7,053,097
ගෙවිය යුතු රැදවුම් දීමනා	95,210	349,435
ගෙවිය යුතු ආරක්ෂක බදු	25,000	25,000
පිරිසිදු කිරීමේ තැන්පතු -1 ගෙවිය යුතු	25,000	25,000
කාර්ය මණ්ඩල ගෙවිය යුතු	219,748	240,328
ආපසු ගෙවන තැන්පතු ගෙවිය යුතු	30,000	30,000
වැටුප් පාලන ගිණුම	-	-
EPF පාලන ගිණුම	-	-
රදවා ගැනීමේ බදු	-	2,055
ආපදා ණය I	-	250,000
හඳුනා නොගත් බැංකු තැන්පතු (24 සටහන)	10,397,234	10,523,125
එකතුව	58,606,756	59,168,139

NOTE 17 ප්‍රගම හා ප්‍රගම නොවන වගකීම්	2020 රු.	2019 රු.
ගෙවිය යුතු පාරිතෝෂික (17(1) සටහන)	32,310,448	27,908,612
ආයෝජන - ආරක්ෂාව - රක්ෂණ නිමේෂා	255,000	255,000
ආයෝජන - ආරක්ෂාව - රසානි දිලිනිකා	50,200	50,200
ආයෝජන - ආරක්ෂාව - 100 චිත්‍ර කරඟකරුවන්	10,000	10,000
එකතුව	32,625,648	28,223,812

සටහන 17 (I) පාරිතෝෂික	2020 රු.	2019 රු.
වර්ෂය මුලදී ඇති ශේෂය	27,908,612	21,483,527
පෙර වර්ෂයේ ගැලපීම්	-	-
වර්ෂය සඳහා ගාස්තු	4,795,056	7,591,673
වර්ෂය තුළ ගෙවා ඇති පාරිතෝෂික	393,220	1,166,588
එකතුව	32,310,448	27,908,612

සටහන 18 සමුච්චිත අරමුදල	2020 රු.	2019 රු.
වසර ආරම්භයේදී පවතින ශේෂය	(39,282,738)	(33,214,576)
පෙර වර්ෂයේ ගැලපීම්	1,251,339	579,368
වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)	(12,041,238)	(6,647,530)
එකතුව	(50,072,636)	(39,282,738)

සටහන 19 ප්‍රත්‍යාගණන සංචිත	2020 රු.	2019 රු.
ආරම්භක ශේෂය	19,479,200	5,610,656
පෙර වර්ෂ ගැලපීම්	23,313,309	13,868,544
කපා හැරීම් අගය	-	-
එකතුව	42,792,509	19,479,200

සටහන 20 ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් අරමුදල	2020 රු.	2019 රු.
ආරම්භක ශේෂය	2,311,497,232	2,186,314,876
පෙර වර්ෂයේ ගැලපීම්	2,793,206	3,308,623
මෙම වර්ෂයේ ගැලපීම්		
වර්ෂය තුළ මාරු කිරීම්	84,063,233	121,873,733
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අරමුදල		
ආරම්භක ශේෂය	94,000,000	94,000,000
වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු කිරීම්	-	-
විශ්‍රාමිකයන්ගේ දීමනා	-	-
එකතුව	2,492,353,672	2,405,497,232

සටහන 21 වැඩිහිටි දීමනා ගිණුම	2020 රු.	2019 රු.
ආරම්භක ශේෂය	1,334,700	1,499,779
මෙම වර්ෂයේ ගැලපීම්	1,500	9,557
වර්ෂය තුළ පොළිය	51,308	48,865
ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ගෙවීම්	(213,000)	(223,500)
එකතුව	1,174,509	1,334,700

සටහන 22 රජයේ දීමනා සහ අරමුදල්	2020 රු.	2019 රු.
ප්‍රාග්ධනය - රජයේ	37,105,344	36,705,344
වාහන -රජයේ	-	-
ප්‍රාග්ධන - නව ශ්‍රවණාගාරයක් ඉදිකිරීම	540,000	540,000
ප්‍රාග්ධන - ප්‍රචර්ධන කටයුතු සඳහා වන අලෙවි ජාලය	2,725,600	2,225,600
ප්‍රාග්ධන - අරමුදල්	163,931,128	163,931,128
එකතුව	204,302,072	203,402,072

සටහන 22 (I) සමාජ ආරක්ෂණ විශ්‍රාම වැටුප් කළමනාකරණ තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීමට ඉදිරියට ගෙනා ප්‍රාග්ධන ශේෂය	2020 රු.	2019 රු.
ආරම්භක ශේෂය	12,511,000	12,511,000
මෙම වර්ෂයේ වෙන් කිරීම්	-	-
එකතුව	12,511,000	12,511,000

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
2004 සිට 2020 දක්වා හඳුනා නොගත් තැන්පතු වල විස්තර
2020.12.31 දිනට

වසර	බැංකුව	2020.12.31 දිනට හඳුනාගත යුතු තැන්පතු වල මුළු වටිනාකම	හඳුනා නොගත් මුළු තැන්පතු ප්‍රමාණය හඳුනාගෙන ඇති නාමුර් 2020.01.10 දින වන විට මිණුම්ගත කර ඇති වටිනාකම	හඳුනාගත යුතු ශේෂය	2020.12.31 දිනට හඳුනා නොගත් තැන්පතු විස්තර		
					බැංකුව විසින් විභාග කරන ලද දත්ත ලෙස හඳුනා ගෙන නොමැති ප්‍රමාණය	දායකයා හඳුනා ගැනීම සඳහා තැන්පතුකරු බැංකු තැන්පතුකෙනේ නිසියු විස්තරයන් නතා නොමැති බැවින් හඳුනා නොගත් ප්‍රමාණය	(f) හා (g) හි සඳහන් කර ඇති හේතු හැර හඳුනා ගැනීමට ඉතිරිව ඇති ප්‍රමාණය
(a)	(b)	(c)	(d)	(e) = (c) - (d)	(f)	(g)	(h)
		Rs	Rs	Rs	Rs	Rs	Rs
2004 -2009	ලංකා බැංකුව	289,641	85,209	204,432	204,432	-	-
	මහජන බැංකුව	939,621	190,581	749,040	749,040	-	-
	ඉතිරි කිරීමේ බැංකුව	160,521	128,021	32,501	32,501	-	-
2010	ලංකා බැංකුව	159,351	106,254	53,097	-	-	53,097
	මහජන බැංකුව	412,822	412,822	-	-	-	-
	ඉතිරි කිරීමේ බැංකුව	527,443	520,440	7,003	-	-	7,003
							-
2011	ලංකා බැංකුව	210,389	201,168	9,220	-	-	9,220
	මහජන බැංකුව	8,544,430	8,535,026	9,404	-	-	9,404
	ඉතිරි කිරීමේ බැංකුව	601,099	599,848	1,251	-	-	1,251
							-
2012	ලංකා බැංකුව	4,324,890	4,323,470	1,420	-	-	1,420
	මහජන බැංකුව	716,631	716,631	-	-	-	-
	ඉතිරි කිරීමේ බැංකුව	4,250,578	4,247,906	2,672	-	-	2,672
							-
2013	ලංකා බැංකුව	3,139,542	3,137,201	2,341	-	2,341	-
	මහජන බැංකුව	4,461,355	4,459,335	2,020	-	2,020	-
	ඉතිරි කිරීමේ බැංකුව	1,037,101	1,025,231	11,870	-	11,870	-
							-
2014	ලංකා බැංකුව	1,672,105	1,670,453	1,652	-	1,652	-
	මහජන බැංකුව	6,500,041	6,493,491	6,550	-	6,550	-
	ඉතිරි කිරීමේ බැංකුව	823,583	822,063	1,520	-	1,520	-
							-
2015	ලංකා බැංකුව	16,177,682	16,154,571	23,111	-	23,111	-
	මහජන බැංකුව	9,927,670	9,902,724	24,946	-	24,946	-
	ඉතිරි කිරීමේ බැංකුව	1,218,604	1,205,044	13,560	-	13,560	-
							-
2016	ලංකා බැංකුව	22,375,693	22,336,773	38,920	-	17,583	21,337
	මහජන බැංකුව	11,364,867	11,364,507	360	-	-	360
	ඉතිරි කිරීමේ බැංකුව	773,205	773,205	-	-	-	-
							-
2017	ලංකා බැංකුව	30,234,011	30,197,125	36,886	-	33,908	2,978
	මහජන බැංකුව	15,590,484	15,577,671	12,813	-	-	12,813
	ඉතිරි කිරීමේ බැංකුව	467,308	467,308	-	-	-	-
							-
2018	ලංකා බැංකුව	37,225,295	35,967,286	1,258,009	-	40,287	1,217,722
	මහජන බැංකුව	12,204,785	11,532,003	672,782	-	-	672,782
	ඉතිරි කිරීමේ බැංකුව	357,918	357,918	-	-	-	-
							-
2019	ලංකා බැංකුව	38,917,698	33,418,442	5,499,256	-	-	5,499,256
	මහජන බැංකුව	9,949,601	9,116,087	833,514	-	-	833,514
	ඉතිරි කිරීමේ බැංකුව	151,412	151,412	-	-	-	-
							-
2020	ලංකා බැංකුව	17,208,016	16,554,285	653,731	-	-	653,731
	මහජන බැංකුව	10,077,668	9,848,282	229,386	-	-	229,386
	ඉතිරි කිරීමේ බැංකුව	77,795	73,827	3,968	-	-	3,968
							-
	එකතුව	273,070,855	262,673,621	10,397,234	985,973	179,348	9,231,914

Remarks:-

(f) හේතුව - බැංකු තැන්පතු පිළිබඳ විස්තර විභාග කිරීම් නිසා 2004 සිට 2009 දක්වා හඳුනා නොගත් වටිනාකම් රු. 985,973.00යි.
විශ්‍රාම වැඩසටහන් හා මූල්‍ය ආයතන ආඥාපනත යටතේ පවරාගෙන ඇති බැංකු හඳුනාගෙන ඇතිය.
පසුගිය කාර්යමේ 09 වන දැනුවත් කිරීමේ වැඩසටහනින් පැහැදිලිය.

(g) හේතුව - හඳුනා නොගත් වටිනාකම් රු. 179,348.00 ක් වන අතර තැන්පතුකරු විසින් එය හඳුනා ගැනීමට හිමිදු විස්තරයක් ඉදිරිපත් කර නොමැත
ඉදිරිය බැංකුවේ රු.යි.
විශ්‍රාම වැඩසටහන් හා මූල්‍ය ආයතන ආඥාපනත යටතේ පවරාගෙන ඇති බැංකු හඳුනාගෙන ඇතිය
පසුගිය කාර්යමේ 09 වන දැනුවත් කිරීමේ වැඩසටහනින් පැහැදිලිය.

(h) හේතුව - වටිනාකම් පරීක්ෂා කළයුතු තැනුවන් කිරීම් සඳහා සැලසිය යුතු කාලයක් ඇත.
එබැවින් වටිනාකම් පරීක්ෂා කළ යුතු තැනුවන් වන මුළු හඳුනා නොගත් රු.යි. 8,200,762.00 ක වටිනාකම් ඇත
2021.12.31 වන විට අවශ්‍ය කියාවලින් තැනුවන් කිරීමට සැලසුම් කර ඇත

(i) හේතුව - මෙම මූල්‍ය හඳුනා ගැනීම් සඳහා දැනට කිසියම් බැංකු ගණනාවක් පිළිබඳ විස්තර නැත.

ආයෝජකයා/ බැංකුව	සහනික අංකය	ආයෝජන			කාලය	ආයෝජන අනුපාතය	ලැබිය යුතු මුළු පොළිය	කල්පිරීමේ වටිනාකම	ලැබිය යුතු පොළිය			ගෙවිය යුතු WHT		
		දිනය		ආයෝජිත මුදල්										
		ආයෝජන	කල්පිරීම						2018	2019	2020	2018	2019	2020
Boc	995718 Dep:Cultr Affairs	06-Jun-2017	06-Jun-2022	40,000,000	60 M	14.50%	29,000,000	69,000,000	5,800,000	5,800,000	5,800,000	464,000	464,000	-
NSB	2011102858012	31-Jul-2017	31-Jul-2022	388,624,537	60 M	13.00%	252,605,949	641,230,486	50,521,190	50,521,190	50,521,190	4,041,695	4,041,695	-
SMIB	SMIBH-D000787	23-Aug-2017	23-Aug-2022	216,260,869	60 M	15.00%	162,195,402	378,472,271	32,440,480	32,440,480	32,440,480	2,595,238	2,595,238	-
SMIB	SMIBH-D000811 Elders Pen	09-Oct-2017	09-Oct-2022	460,000,000	60 M	14.50%	333,500,000	793,500,000	66,700,000	66,700,000	66,700,000	5,336,000	5,336,000	-
HDFC	9992020000131	8-Dec-2017	08-Dec-2022	113,000,000	60 M	15.50%	87,575,000	200,575,000	17,515,000	17,515,000	17,515,000	1,401,200	1,401,200	-
PB	17460010002117 9-7	18-Oct-2018	18-Oct-2023	271,481,506	60 M	14.00%	190,037,054	461,518,561	7,809,742	38,007,411	38,007,411	390,487	1,900,371	-
HDFC	9992030000114/31	9-Jan-2020	09-Jan-2021	21,553,121	12 M	11.00%	2,370,843	23,923,964			2,318,880			115,944
HDFC	9992010000115/8	15-Jul-2020	14-Jul-2021	20,151,000	12 M	8.50%	1,712,835	21,863,835			707,759			-
HDFC	9992010000115/9	13-Aug-2020	13-Aug-2021	10,681,000	12 M	7.50%	801,075	11,482,075			369,456			-
HDFC	9992010000115/11	4-Sep-2020	4-Mar-2021	176,061,000	6 M	6.25%	5,456,685	181,517,685			3,587,544			-
HDFC	9992010000115/12	22-Oct-2020	22-Jul-2021	11,200,000	3 M	5.50%	155,266	11,355,266			119,825			-
HDFC	JAIA-9992010000115/13	22-Oct-2020	22-Oct-2021	3,000,000	12 M	6.50%	195,000	3,195,000			37,932			-
PB	17460010002589-2	9-Nov-2020	9-Feb-2021	52,488,000	3 M	5.25%	694,567	53,182,567			400,131			-
HDFC	System-9992010000115/16	13-Nov-2020	13-Feb-2021	12,910,089	3 M	5.25%	170,838	13,080,926			90,900			-
PB	Culture	16-Dec-2020	16-Mar-2021	62,832,557	3 M	4.75%	735,916	63,568,473			130,929			-
Total				1,890,252,679			1,067,213,430	2,927,466,110	181,786,412	210,984,081	218,777,427	14,228,621	15,738,504	115,944

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

2020 දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

ආදායම් සහ වියදම් ප්‍රකාශය - විශ්‍රාම වැටුප් අරමුදල

විස්තරය	2020 (රු.)	2019 (රු.)
සාමාජික දායක මුදල් අයකර ගැනීම්		
තැපැල් එකතු කිරීම්	144,789,355	143,491,961
බැංකු සහ වෙනත් එකතු කිරීම	76,086,465	92,169,394
එකතුව (a)	**220,875,820**	**235,661,355**
එකතු කළා - පොලී ආදායම		
ස්ථාවර තැන්පතු	238,562,470	259,919,300
ඉතිරි කිරීම් තැන්පතු	1,232,094	2,236,219
වෙනත් (ආපදා ණය II)	4,240	10,033
වෙනත් (ආපදා ණය III)	724,042	950,911
සංස්කෘතික අරමුදලේ පොළිය	7,321,309	6,215,142
පොලී ආදායම - ජාලය	37,932	
පොලී එකතුව (b)	**247,882,087**	**269,331,605**
අඩුකලා - වියදම		
විශ්‍රාම වැටුප් ගෙවීම්	331,553,955	312,727,588
අරමුදල් ගෙවීම්	27,946,174	25,304,571
පාරිතෝෂික ගෙවීම්	2,135,828	2,103,055
අබාධිත දීමනා ගෙවීම්	589,719	657,064
දායකයින්ට ප්‍රතිලාභ ගෙවීම්	2,928,000	2,775,394
තැපැල් කොමිස්	(24,360)	825
දිරිදීමනා ගෙවීම්	11,188,589	15,649,535
සමාජ ආරක්ෂණ සංවර්ධන වියදම්	-	-
කාර්ය මණ්ඩල රක්ෂණය	752,000	755,000
වාහන කුලී	-	-
බැංකු ගාස්තු	22,720	59,289
තැපැල් කොමිස්	7,301,104	-
වෙනත්	185,000	
රඳවා ගැනීමේ බදු - අරමුදල	115,944	17,008,980
රඳවා ගැනීමේ බද්ද - ඉතිරිකිරීම්	-	114,532
රඳවා ගැනීමේ බද්ද - සංස්කෘතිය	-	475,342
212 ගිණුම් අතර මාරු කිරීම	-	5,488,052
මුළු වියදම (c)	**384,694,673**	**383,119,227**
ශුද්ධ ශේෂය (a) + (b) - (c)	**84,063,233**	**121,873,733**

සටහන්:

01.01.2020 සිට 31.12.2020 දක්වා මුළු ආදායම් එකතුව රු. 231,273,054.12

මෙම මුදලෙන් හඳුනා නොගත් තැන්පතු වල මුළු එකතුව රු. 10,397,234.00 කි.


මෙය ශේෂ පත්‍රයේ දක්වා ඇත්තේ ජංගම වගකීම් ලෙස වේ. (23 සටහන)


ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ජග්/ඊඛබ/ඔ/ඵස්ඵස්බ්/01/2020/04

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2021 ජූලි 27 දින





යහපාපති

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

පිටපත් :01. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික,ක්ෂුද්‍ර මූල්‍ය ,ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය

02. ලේකම් - මුදල් අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 33 +94 11 2 88 72 23 auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. | එල්ඊඩබ්/ඕ/එස්එස්සී/01/2020/04 | ඔබගේ අංකය உமது இல. Your No | දිනය திகதி Date | 2021 ජූලි 27 දින

සභාපති

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.2 නත්ත්වාගණනාවය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01හි 76 ඡේදය ප්‍රකාරව වාර්තාකරන දිනයෙන් පසුව මාස 12ක් තුළදී උපලබ්ධි වෙතැයි අපේක්ෂා කරන වත්කම්, ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.370,876,767ක් වූ වර්ෂයකට අඩු කාලයක් තුළ කල් පිරීමට නියමිත ස්ථාවර තැන්පතු ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 90 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ පන්තියක් ප්‍රත්‍යාගණිත අගයන්ට ප්‍රකාශ කර ඇති විට මූල්‍ය ප්‍රකාශන වල එම ප්‍රත්‍යගණනයට අදාළ තොරතුරු හෙළිදරව් කල යුතු වුවත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ පිළිවෙලින් රු.97,050,000කට හා 74,449,000කට ප්‍රත්‍යාගණනය කර තිබුණු ඉඩම් හා ගොඩනැගිලි වල විස්තර ප්‍රමිතිය ප්‍රකාරව අනාවරණය කර නොතිබුණි. එසේම ප්‍රමිත අංක 07 හි 49 ඡේදය ප්‍රකාරව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විට එම වත්කමට අයත්වන වත්කම් පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත් 2020 ජනවාරි 01 දිනට මණ්ඩලය සතුව තිබුණු පිරිවැය රු.161,241,180 ක් වූ ගොඩනැගිලි අතරින් පිරිවැය රු.138,151,000ක් වූ ගොඩනැගිලි පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) 2020 දෙසැම්බර් 31 දිනට විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ 2004 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා යෝජනා ක්‍රමය සඳහා බඳවාගත් දායකයන් විසින් ගෙවා තිබූ රු.10,397,234ක් වූ දායක මුදල් ගෙවීම්, අදාල දායකයන් ගෙවා තිබුණු මුදල් ප්‍රමාණයන් අනුව වෙන්කර හඳුනාගැනීමට අදාල විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයට අදාල නොවූ රු.1,251,339 ක් ශ්‍රීලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 02 ට අදාල පටහැනිව මෙහෙයුම් ලාභයට ගලපා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අංශකුත් නොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් මණ්ඩලයේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාලව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබාගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

අපේක්ෂායක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් යුතාර් බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු

මූල්‍ය ප්‍රකාශනවල ඵලදායීතාවය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා යාථාර්තයට ඇතුළත් වී ඇති බව සහ ගෙදරවේ කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2. 1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම යටතේ දක්වා ඇති නිරීක්ෂණවලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුවම අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	ලේඛනය/ව්‍යාකාරය	නිරීක්ෂණ
(අ)	2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම අවම වශයෙන් වසර තුනක (3) කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවද මෙයට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

3. වෙනත් කරුණු

(අ) විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ එකතු වූ මුදලින් මණ්ඩලයේ සේවකයන්ට සියයට 9.5 ක පොළියට ආපදා ණය ලබා දී තිබූ අතර 2020.දෙසැම්බර් 31 දිනට අයකරගතයුතු ශේෂය රු.9,038,538 ක් විය.

(ආ) අඩු ආදායම්ලාභීන්ගේ අනාගතය සුරක්ෂිත කිරීම සඳහා ක්‍රමවේදයක් ඇති කිරීම යන මැයෙන් ක්‍රියාකාරී සැළැස්ම තුල මණ්ඩලයේ විශ්‍රාම වැටුප් ක්‍රමයට සාමාජික බඳවාගැනීම් ඉලක්කය පුද්ගලයින් 35,000ක් ලෙස සැළසුම් කර තිබුණද වර්ෂය තුළ සත්‍ය බඳවාගැනීම් 25,678ක් විය. 2020 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ විශ්‍රාම අරමුදල් යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ලාභීන් සංඛ්‍යාව 31,769ක් විය.

(ඇ) මණ්ඩලයේ මූලික අරමුණ ධීවර හා කෘෂිකර්ම නොවන අංශවල ස්වයං රැකියාවල නියුතු විශ්‍රාම වැටුපක් ලබාදීම වේ. එහිදී එම යෝජනා ක්‍රම වලට සාමාජිකයින් බඳවාගැනීම සිදුකරනු ලබන්නේ සම්බන්ධීකරණ නිලධාරීන් මඟිනි. මණ්ඩලය සඳහා සම්බන්ධීකරණ නිලධාරී තනතුරු 49ක් අනුමතව පැවතිය ද ඉන් නිලධාරීන් 17 දෙනෙකු වර්ෂ 02ක් පමණ කාලයක සිට පුරප්පාඩුව පැවතිණි. එම තත්ත්වය සාමාජිකයින් බඳවාගැනීම් අඩුවීමට එක් හේතුවක් වී ඇති බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති